# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්

www.budusarana.lk Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2563 ක් වූ
වෙසක් පුර අටවක පෝය දින
රාජ්‍ය වර්ෂ 2020 අප්‍රේල් 30 වනදා බ්‍රහස්පතින්ද
BUDUSARANA THURSDAY APRIL 30, 2020
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.
54 වන කාණ්ඩය, 43 වන පත්‍රය , පිටු 16
ආරම්භය 1965 - 06 - 13




## සේරිවාණිජ ජාතකය

සිතුවම
සමන් ශ්‍රීකාන්ත



බොදු පිළිවෙතින් ගලා යන
මෛත්‍රී ගංගාව

පිටුව 02



හෙට රට බබළවන මිණිමුතු

පිටුව 04



සසුන් කෙත සුරකින
කැඩපත

පිටුව 06



තමන්ට තමන්
පහනක් වන්න

පිටුව 13

නිර්මාණ දායකත්වය
කාශ්‍යප බණ්ඩාර

# බොදු පිළිවෙතින් ගලා යන මෛත්‍රී ගංගාව



ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය
**මැදගොඩ අභයතිස්ස නා හිමි**

**අද අප භයානක වසංගත රෝග යකට මුහුණ දී සිටිනවා. මෙබඳු කලින් කලට ඇතිවන රෝග ආපදාවන් ලෝක ඉතිහාසය පුරාවටම දක්නට ලැබෙනවා. බුද්ධ කාලයේ ඇති වූ අහිවාතක රෝගය එබඳු එක් අවස්ථාවක් හැටියට දකින්නට පුළුවන්.**

ඒ රෝග අවස්ථාවේ දී මිනිසුන් වහලය බිඳ ගෙන, ගොස් බිත්ති කඩාගෙන ගෙයින් පිට වූ බවයි සඳහන් වන්නේ. ඒ අනුව අටුවාව පැහැදිලි කරන්නේ එය වාතයෙන් බෝවන රෝගයක් ලෙසටයි. බිඳිති මගින් බෝ වනවා වැනි තත්ත්වයක් නිසා ඒ රෝගය වාතයෙන් බෝ වන රෝගයක් බව සිතුවා වන්නට ද පුළුවන්.

ලංකාවේ ද මෙබඳුම රෝගයක් ගැන අපට එක් අවස්ථාවක අසන්නට ලැබෙනවා. එය යක්ෂ උවදුරක් ලෙසයි හඳුන්වා තිබුණේ. එම 'රක්තාක්ෂි' උවදුර අවස්ථාවේ දී රෝගය වැළඳුණ කෙනෙක් දකින දකින කෙනාට රෝගය බෝ වූ බව සඳහන්. එබඳු අවස්ථාවල දී අපේ රජවරු එම උවදුරු ජය ගත්තේ ආධ්‍යාත්මික ශක්තිය උපයෝගී කරගෙනයි. ඒ වගේම අතීතයේ අප බරපතළම උවදුරු කිහිපයකට මුහුණ දුන් අවස්ථාවක් වන්නේ වළගම්බා රාජ සමයේ ඇති වූ බැමිනිටියා සාගතය අවස්ථාවයි.

එක පැත්තකින් බ්‍රාහ්මණ සින්ධු කියන දාමරිකයා රට ආක්‍රමණය කරන්නට පැමිණ තිබුණා. රටට රාජ්‍යත්වය අහිමි ව තිබුණා. ඒ වෙලාවේ අපට රජෙක් සිටියේ නෑ. ඊළඟට අවුරුදු 12ක් තිස්සේ දැඩි නියං සාගතයක් තිබුණා. මිනිසුන් රෝග පීඩාවන්ගෙන්, පරසතුරු උවදුරෙන්, අරාජිකත්වයෙන් පීඩා විඳිමින් සිටි නමුත් ඒවායින් ගොඩ ඒමට කටයුතු කළා. එපමණක් නොවෙයි, මුළු මහත් ලෝකය ම විස්මයට පත් කරමින්, මුළු බෞද්ධ ලෝකයටම මහා අස්වැසිල්ලක් වන පරිදි ත්‍රිපිටකය ග්‍රනථාරූඪ කිරීම සිදු වුයේ ද ඒ බැමිනිටියා සාගතයෙන් අනතුරුවයි.

ඒ වගේම යම් යම් කාලවල ලෝකයේ මෙබඳු අවස්ථාවන් ඇති වීම ස්වාභාවික තත්ත්වයක්. 'යුග කෘත තේත්‍රා ද්වාපර කලි' යනුවෙන් අපේ පෙරදිග සාහිත්‍යයේ සඳහන් වෙනවා. යුග කෘත කියන්නේ ලෝකය නිර්මාණය වන කාලය. ඒ කියන්නේ ලෝකය සකස් වෙමින් පවතින කාලය. තේත්‍රා නම් තුන්පැත්තකින් ආවරණය වූ කාලයයි. ද්වාපර කියන්නේ දෙපසකින් ආවරණය වූ කාලයයි. කලියුගය කියන්නේ අනාරක්ෂිත යුගයයි.

මේ කාලය ගැන කතා කරන විට අපේ ලෝකය අනාරක්ෂිතයි. මිනිසුන් අධි පරිභෝජනවාදී වෙලා, ඒ මානසිකත්වයෙන් පරිසරය මුළුමනින් ම තමන්ගේ යටතට ගෙන කටයුතු කළා. එහි ප්‍රතිඵල රෝග ව්‍යසන හැටියට, ඔවුන් වෙතටම පෙරළා පැමිණ තිබෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සදහම් කරුණු සමඟ දැන් මේ රෝග තත්ත්වය පිළිබඳව අපට සිතන්නට සිදුව තිබෙනවා.

නිදසුනක් ලෙස බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේට අනුදැන වදාරනවා ජලය අපවිත්‍ර කරන්න එපා. පරිසරය අපවිත්‍ර කරන්න එපා. ගස්වැල් කපා දමන්න එපා යනුවෙන්. ඒ විදියට සිතා මේ අනුශාසනා කර තිබෙන්නේ මීට වසර 2600කට එහා පැත්තේ. ලෝකයේ වනග හනය හොඳින් තිබූ, කාර්මිකරණයත් සමග වායු දූෂණය පිළිබඳව බරපතළ තර්ජනයක් නොවූ අවස්ථාවකයි. එහෙත් ඒ අවස්ථාවේ පවා උන් වහන්සේ පරිසර සංරක්ෂණයේ තිබූ වැදගත්කම දේශනා කර තිබෙනවා.

අපේ සම්ප්‍රදායේ තවත් නිදසුනක් ගෙන බැලුවහොත්, අප මේ දිනවල මුඛ ආවරණ පැළඳීම ගැන විශේෂ අවධානයක් යොමු කරනවා. මුඛ ආවරණ පැළඳීම දළදා වහන්සේ වෙනුවෙන් කරන පූජාවේදී, වෙනත් උසස් පූජාවන්වල දී බෞද්ධ ජනතාව විසින් සිදුකරනු ලබනවා. ඒ කියන්නේ කෙළ බිඳිති පිටවෙන බව අප දැනගෙන සිටියා.

ඒ වගේම භික්ෂූන් වහන්සේ ධර්මය දේශනා කරන අවස්ථාවන් හිදී වටාපත පරිහරණය කරනවා.. එවිට ධර්ම දේශනා කරන අවස්ථාවේ දී උන්වහන්සේ වෙතින් කෙළ බිඳක් හෝ පිට වෙන්නේ නෑ. වටාපත නිසා අනෙක් අය ආරක්ෂා වුණා. එහිදී හස්ත විකාර, මුඛ විකාර ආදියත් වළකිනවා. ඒ වගේම තමයි මේ නිරෝධායන සංකල්පය. එය ක්‍රියාත්මක වන්නේ මෛත්‍රීය පදනම් කරගෙනයි.

'සබ්බේ සත්තා භවන්තු සුඛිතත්ථා'
සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා! කියන හැඟීම එහි තිබෙනවා. අප, අපට සෑදෙන රෝගයක් තව කෙනකුට බෝ වෙන්න ඉඩ දෙන්නේ නෑ. තමන් නිරෝධායන වෙනවා. ඒ නිසා තමයි දෙයියන්ගේ ලෙඩ කියලා බෝවෙන රෝග වැළඳුනාම අප නිවෙස්වල නිරෝධායනය වන්නේ .



ඒ සඳහා අපට පොලිසියෙන් පැමිණ දැන්වීම් එල්ලන්න අවශ්‍ය වන්නේ නෑ. අපේ ගෙවල්වල දොරකඩ කොහොඹ අත්තක් එල්ලනවා. එවිට කවුරුත් දන්නවා මේ ගෙ දර බෝ වෙන රෝගයක් තිබෙනවා කියලා. මේ නිරෝධායනය වන ගෙදරක් කියලා. මෙතැන සිදු වන්නේ කුමක්ද? මෛත්‍රී සිතුවිලි මත තමන් එතනින් රෝගය අවසන් කරගන්නා නිරෝධායනයයි.

බුදුරජාණන් වහන්සේගේ දේශනාවන් දෙස බැලීමේදී අපට පැහැදිලි වෙනවා පවිත්‍රතාව මොනතරම් අගයකොට තිබෙනවාද යන බව. ඒ දහම් මඟ ගමන් කළා අපේ සමාජය. අපේ නිවෙස්වල අවුරුද්දකට වතාවක් ගොම මැටි ගාලා විචිත්‍ර කරලා මුළු ගෙය ම නැවුම් බවට පත්කළා. ඒ විතරක් නෙවෙයි කහ දියරෙන් සෝදනවා. ඉතින් අද අප මේ කතා කරන විෂබීජහරණය නිරෝධායනය මුඛ ආවරණ පැළඳීම, අපට අලුත් දේ නොවේ.

> හික්ෂූන් වහන්සේ ධර්මය දේශනා කරන අවස්ථාවන් හිදී වටාපත පරිහරණය කරනවා. එවිට ධර්ම දේශනා කරන අවස්ථාවේ දී උන්වහන්සේ වෙතින් කෙළ බිඳක් හෝ පිට වෙන්නේ නෑ. වටාපත නිසා අනෙක් අය ආරක්ෂා වුණා. එහිදී හස්ත විකාර, මුඛ විකාර ආදියත් වළකිනවා. ඒ වගේම තමයි මේ නිරෝධායන සංකල්පය. එය ක්‍රියාත්මක වන්නේ මෛත්‍රීය පදනම් කරගෙනයි.

එහෙත් අද අප බටහිරින් ගත් චාරිත්‍ර වාරිත්‍ර අනුව මිනිසුන්ට අතට අත දීම සිප වැළඳ ගැනීම වැනි දේට පුරුදු වෙලා. අපේ චාරිත්‍රය ආයුබෝවන් කීමයි. ආයුෂ බොහෝ වේවා කියලා දුර සිට ආචාර කිරීමයි. ඒ ආචාරය තුළ කවදාවත් මේ වගේ රෝගයක් බෝ වීමට ඉඩ දුන්නේ නැහැ.

එපමණක් නොවෙයි අද වෛද්‍යවරු පවා කියනවා අවම ආහාරයකින් යැපී තමන්ගේ ජීවිතය පවත්වා ගැනීම වැදගත් කියලා. බුදු දහම කතා කරන්නේත් 'යාවදේව ඉමස්ස කායස්ස ඨිතියා' යනුවෙනුයි. ආහාර ගත යුතු මේ ශරීරයේ පැවැත්ම සඳහා පමණයි. ඒ නිසා අවම ආහාරයකින් යැපීම මුළු මහත් ලෝකයටම යහපතක්. කුමක් නිසාද? මානවයාගේ අධි පරිභෝජනය තුළ වැඩි වැඩියෙන් නිෂ්පාදනය කිරීමට සිදු වෙනවා. ඒ නිෂ්පාදනයන් විනාශ වෙනවා. එවිට සිදු වන්නේ මේ පරිසරයට හානි සිදුවීමයි.

මිනිසාට වැරදුණ තැනක් තිබෙනවා. ඔහු තමන්ගේ පරිභෝජන අවශ්‍යතා සපුරා ගැනීමේදී පරිසරය ගැන සිතුවේ නැහැ. ලෝකයේ දියුණුව ලෙස කල්පනා කළේ තාක්ෂණික දියුණුවයි. ඔවුන් ලෝකයේ දියුණුව ලෙස කල්පනා කළේ ඕසෝන් ස්ථරය රැක ගැනීම, වන වගා කිරීම, පරිසරයේ ඔක්සිජන් ප්‍රමාණය අඩු කර ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීම නොවේ.

එක රටක් දියුණු වන විට අනෙක් රට දියුණුව යැයි කල්පනා කළේ තාක්ෂණික දියුණුව ගැනයි. නමුත් අද ඒ සියල්ල පාරා වළල්ලක් බවට පත් වෙලා. මානවයාට අභියෝගයක් බවට පත්වෙලා. මේ නිසා අපට වහ වහා ම බුදු දහමේ සඳහන් කරන ප්‍රතිපත්තියට එන්නට සිදුවෙනවා. ඒ ප්‍රතිපත්ති මාලාව තුළ කිසිදු සත්වයෙක් තවත් සත්ත්වයකුට හානි නොකරන ස්වයං ප්‍රතිපත්තියකට එනවා.

බෝවන රෝග පමණක් නොවෙයි බෝ නොවන රෝග වළක්වා ගැනීමටත් බුදු දහමේ ප්‍රතිපත්ති මාලාවක් තිබෙනවා. ඒ සඳහා බෞද්ධ ජීවන රටාව නැවත මතුකර ගත යුතුයි. තමන් සුවපත් වී, අනුන්ද සුවපත් කරවන වැඩ පිළිවෙළක්. එහිදී හැම මොහොතකම සලකා බැලුවේ අප කෙතරම් දුරට පරිසරය රැක ගන්නවාද කියන කරුණයි. අපේ ගොවිතැන දෙස බලන්න. එදා එය පරිසරය රකින ගොවිතැනක් වුණා. අද රසායනික පොහොර නිසා මිහිතලයේ භූගත ජලය විෂ බවට පත්කරගෙන අවසන්. ඒත් මේ තත්ත්වය කාලාන්තරයක් පාලනය කරගන්න හැකි වූයේ නම් නැවතත් විෂ නැති මහ පොළොවක් අපට හදාගන්නට පුළුවන්. ඒත් ලෝකය හිතන්නේ ඒ ගැන නොවෙයි. අද කතා කරන්නේ කාර්මික විප්ලවය හා සමගාමීව යන කෘෂි විප්ලවය ගැන. එහිදී ක්ලෝනකරණයි වැනි දේ ගැන සිතනවා. පසුගිය කාලය පුරා ලෝකය බීජවල පවා බීජ ගුණය වෙනස් කළා. දොඩම් ගෙඩියේ ලෙල්ල පවා ලෙහෙසියෙන් ගලවා ගන්න පුළුවන් තැනටයි කල්පනා කළේ.

රමණී සුබසිංහ

# ආනන්තරීය පාප කර්ම හැර සියලු පව් යටපත් කරන බුද්ධ වන්දනාව





**කහගොල්ලේ සෝමවංශ හිමි**

**බුද්ධ වන්දනාව බුදුරජාණන් වහන්සේ ම අනුදැන වදාළ පින්කමක්. බුදුරජාණන් වහන්සේ දවසක් භික්ෂූන් වහන්සේ සමඟ වෙල් යායක් හරහා වැඩම කරමින් සිටියා. එක්තරා බ්‍රාහ්මණයෙක් තමන් කුඹුරේ වැඩ අරඹන්න පෙර එක්තරා ස්ථානයකට වැඳ නමස්කාර කර කුඹුරු වැඩට සූදානම් වුණා. බුදුරජාණන් වහන්සේ, මෙහි ඔබ වැඳ නමස්කාර කරන්නේ කුමටද යනුවෙන් විමසුවා .**

එවිට බමුණා පැවසුවේ ස්වාමීනි, අපේ පිය පෙළපතේ සැවොම මෙම ස්ථානයට වැඳ නමස්කාර කර කුඹුරු වැඩ ඇරැඹූ බැවින්, මා ද මෙලෙස කුඹුරු වැඩ අරඹන බව පැවසුවා. බොහොම හොඳයි බමුණ. ඔබ ඉතාම සුදුසු තැනකට යි වන්දනා කළේ යනුවෙන් බුදුන් වහන්සේ වදාළා.

මහණෙනි, කාශ්‍යප බුදුරජාණන් වහන්සේ පරිනිර්වාණයට පත් වුණාම ඒ ධාතූන් වහන්සේ තැන්පත් කළ සෑ රඳුන් වහන්සේ තිබුණේ මෙතැනයි යනුවෙන් ගෞතම බුදුන් වහන්සේ පහදා දී, බුද්ධ ආනුභාවයෙන් සෑය මතු කර පෙන්නුවා. බමුණා ඇතුළු පිරිසට බුද්ධ වන්දනාවේ අනුහස් පැහැදිලි කළ විට සෝවාන් මාර්ග ඥානයෙන් විශාල පිරිසක් නිවනට පත් වුණා. ඒ නිසා බුද්ධ පූජාව, බුද්ධ වන්දනාව සාමාන්‍යය දෙයක් වශයෙන් සලකන්න එපා. ඇතැමෙකු මෙවැනි විශාල පූජාවන් කුමටද කියා සිතනවා. එලෙස නිකම්වත් සිතන්න එපා. බුදුරජාණන් වහන්සේ තරම් පූජා සත්කාර කළ උත්තමයෙක් ලොවේ කොහේවත් නැහැ. බුද්ධ පූජාවට කෙතරම් දෙයක් පූජා කළත් ඒ ගැන සිතා සතුටු වන්න. එය විශාල පිනක්. රුවන්මැලි මහා සෑයට කෙතරම් පළඳනාවන් පළඳවනවාද? කෙතරම් පූජාවන් කරනවාද? ඒ ගැන සිතා සතුටු වන්න. ඒ නිසා බුද්ධ වන්දනාව ගෞරවයෙන් කරන්න. හැකිතාක් පූජා සත්කාරයන් සිදු කරන්න. මේවා අනුන්ට නෙමෙයි තමන්ට යි. සංසාර ගමන දුකෙන් සිටින්නේ නැතිව සැපවත් ජීවිත පෙළක් ලබාගෙන සංසාර දුකෙන් නිදහස් වෙන්නට, අපායෙන් නිදහස් වෙන්නට පුළුවන්.

අනන්ත බුදු, පසේ බුදු, මහ රහත් උතුමෝ තුනුරුවන්ට ගෞරවය පුද කළා. බුදුරජාණන් වහන්සේ තම ගුරුවරයා වශයෙන් ධම්ම රත්නයට ගෞරවය පුද කළා. සිතේ ප්‍රසාදය නැගෙන තරමට ම පූජාව මහත්ඵල මහානිසංස වෙයි. මල්, පහන්, ගිලන් පස, දාන මාන පූජා කර ලක්ෂ ගණන් මනු ලොව, දෙව් ලොව, බඹ ලොව සිටි චරිත තිබෙනවා. බුදු කෙනෙකුට දෑත් එකතු කර වන්දනා කළත් එය විශාල පිනක්. අනඳ හාමුදුරුවෝ දවසක් දෑත එකතු කර වැඳගෙනම කථා කළා.

ඒ ආනිසංසය මෙලෙස පහදා දුන්නා. ආනන්දය, ඔබට වන්දනාමය පිනෙන් සක්විති රජකම් සතක් ද ශක්‍ර භවනේ හත් වරක් ද, ප්‍රදේශ රජකම් ද සීමාවක් නැහැ. නමුත් ආනන්දය ඔබ එතරම් සම්පත් අත් නොවිඳ මේ ජීවිතයේ ම රහත් ව නිවනට පත් වන බව වදාළා. බලන්න දෑත එකතු කර වන්දනා කිරීමේ කුසල බලය කෙතරම් ද කියා. ඒ නිසා දෑත් එකතු කර තමන්ගේ නිවසේ තුනුරුවන් වන්දනාව ශ්‍රද්ධාවෙන් කර ගන්න. එය නිවසටත්, තමන්ටත්, දකින්නන්ටත්, පළාතටත් හොඳයි. මෙලොව පරලොව දෙලොවටත්, සංසාරෙටම හොඳයි. නිවන් සුව අවබෝධ කරගන්න පුළුවන්.

මේවා තුනුරුවන් වන්දනාවෙන් ලැබෙන පිනක් බව වටහා ගෙන කටයුතු කරන්න. ප්‍රඥා පාරමිතාව හොඳින් පිරෙයි. බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ, සිහි වෙනකොට අනුස්සති භාවනාවක් වශයෙන් වැඩෙනවා. බුද්ධ වන්දනාවෙන් අකුසල කර්ම පවා යටකරන්න පුළුවන්. පංචානන්තරීය පව් හැර අන් සියලු පව් යට කරන්න පුළුවන්. මේ ගැන සිතා කල්පනා කර කවුරු වුණත්, බුද්ධ පූජාවට, වන්දනාවට ගෞරවය පුද කළ යුතු යි. එවිට කාටවත් වරදින්නේ නැහැ.

අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාගේ චරිත දෙස බැලීමේ දී උන් වහන්සේ බුද්ධ පූජාව, බුද්ධ වන්දනාව ගෞරවයෙන් කර තිබෙනවා. ඒ උතුමෝ ඉහත ආත්ම භාවයන්හි සුගතියකම විසුවා. මේවා ගැන සිතන්න, කල්පනා කරන්න, පින වර්ණනා කරන්න, පවට නිග්‍රහ කරන්න. එවිට යහපත් වෙයි. බුදුරජාණන් වහන්සේ, රහතන් වහන්සේලාට ප්‍රකාශ කර තිබෙන්නේ පින කෙතරම් සැප විපාක දුන්නාද යනුවෙන්. අවසානයේ ත්‍රිවිද්‍යා අෂ්ට විද්‍යාවන්ගෙන් සමන්විතව පටිසම්භිදා ප්‍රාප්තව රහත්වී තිබෙනවා. එතරම්ම බුද්ධ පූජා වන්දනාව වටිනවා.

මහා ප්‍රජාපතී ගෝතමිය ද , පියුමතුරා බුදුරජාණන් වහන්සේ වගේ ශාසන කාලයේ නිතර පන්සලට යන සැදැහැවතියක්. බුද්ධ වන්දනාව, බණ ඇසීම, භාවනාව, දන් දීම, කරනවා. මෙලෙස තුනුරුවන්ට වන්දනා කිරීමේ පින ඇයට කල්ප ලක්ෂයක් සැප විපාක දුන්නා. නරකාදී සතර අපා දුකෙන්, දුගී දුප්පත් භාවයෙන් අත් මිදුණා. දෙව්ලොව, බඹ ලොව, රජගෙදර උපත ලැබුවා. රාජ මහේෂිකාවක් වුණා. මෙලෙස සියලු සත්කාර ලැබීමට වන්දනා කිරීමේ පින, හේතු වූ බව ඒ උත්තමාවිය වදාළා. සතර අපායක් පැත්තකටවත් නොගොස් එතරම් මනරම් ජීවිත පෙළක් ලබන්නට, මහත් ආනුභාව බලයක් ලැබුණේ තුනුරුවන්ගේ ආනිසංස නිස යි. මේ ගැන සිතා කවුරුත් චිත්ත

අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාගේ චරිත දෙස බැලීමේ දී උන් වහන්සේ බුද්ධ පූජාව, බුද්ධ වන්දනාව ගෞරවයෙන් කර තිබෙනවා. ඒ උතුමෝ ඉහත ආත්ම භාවයන්හි සුගතියකම විසුවා. මේවා ගැන සිතන්න, කල්පනා කරන්න, පින වර්ණනා කරන්න, පවට නිග්‍රහ කරන්න. එවිට යහපත් වෙයි.

ප්‍රසාදයෙන් නුවණ පහළ කරගෙන නිවන් සුව පතා බුද්ධ පූජා වන්දනාව කර ගන්න.

ඡත්ත මානවක උපාසක තුමාට විශාල විපතක් වන බව බුදුරජාණන් වහන්සේ දැක මඟ වැඩම කර ගාථා තුනක් වදාළා. 'යො වදතං පවරො මනු ජෙසු' යනුවෙන් මේ ළමයා වීණාවත් වාදනය කරමින් ම ගාථා තුන ගායනා කළා.

මේ දරුවා ගුරු පඬුරු රැගෙන යන බව සොර සතුරන් දැන ඔහුව දුන්නෙන් විද මරා මුදල් පැහැර ගත්තා. මේ දරුවා මිය ගොස් සුගතියේ උපත ලැබුවා. තුනුරුවන් සරණ ගිය, තුනුරුවන්ගේ ගුණ ගායනා කළ දරුවෙක්, මහා දිව්‍ය රාජයෙක්ව උපත ලැබුවා. බුදුරජාණන් වහන්සේ ද ඒ මළ කඳ ළඟට වැඩම කර ගමේ ජනතාව, ඥාතීන්, දිසාපාමොක් ආචාර්යවරයාගේ සිසුන් සියල්ල ද මෙතැනට එක් රැස් වුණා. මෘත සිරුර අයත් දෙව් ලොව උපන් දිව්‍ය පුත්‍රයා ද මෙහි පැමිණියා. බුදුන් වහන්සේ එදා බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ විශේෂ දේශනාවක් සිදු කළා. බුදු ගුණ සිහිකිරීම, බුද්ධ පූජාව ආදියෙහි ආනිසංසය පහදා දුන්නා. එයින් දිව්‍ය පුත්‍රයා ඇතුළු විශාල පිරිසක් නිවනට පත් වුණා. එහිදී දිව්‍ය පුත්‍රයා බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ ගායනා කිරීමේ පිනෙන් මහා දිව්‍ය රාජයෙක් වුණා යැයි තුනුරුවන් වන්දනා පූජාවේ විපාක වාරය පහදා දුන්නා. මේවා හොඳින් කවුරුත් කල්පනාවෙන් ලොවුතුරු බුදු දහම කෙරෙහි පැහැදීමෙන් ගෞරව සම්ප්‍රයුක්තව ම වැඩි වැඩියෙන් පින් දහම් කළොත් වරදින්නේ නැතිව සුගතියක වාසය කළ හැකියි.

විශේෂයෙන් අපායෙන් නිදහස් විය හැකි යි. එතරම් වාසනාවක් ලොවේ තවත් නැහැ. එසේනම් පිනට දහමට අනුව කටයුතු කර තම චිත්ත සන්තානයේ පවතින සති, ධම්මවිජය, විරිය,පීති, පස්සද්ධි, සමාධි, උපේක්ෂා යන බොජ්ඣංග ධම්ම හත හැකිතාක් දියුණුවෙන් තම බෝධි පාක්ෂික ධර්මද දියුණුවෙන් සිත ගත නිවා සනසාගෙන මේ ගමන ඉදිරියට යන්න. අඩුපාඩු දෙස නොබලා ඒවා ඉවසා දරාගෙන ශ්‍රද්ධා දී ගුණ දියුණුවෙන් ආපස්සට නොගොස් ඉදිරියටම යන්න.

ඒ නිසා ලොවුතුරා බුදු දහමේ සඳහන් කරන ජය සංකේතය වන නිවන් සුව දක්වා යාමට උතුම් ගමන් මග බුදුන් වහන්සේ අපට පහදා දුන්නා. ඒවා හොඳින් කල්පනාවෙන් පිනට දහමට ගුණයට නැඹුරුව ශීලාදී ගුණ දියුණුවෙන් සම්මා සම්බුද්ධ ශාසනය ද රැකගෙන ඉදිරියට ගියොත් තම ජීවිතයේ මෙලොව මෙන්ම පරලොව ද බැබළී නිර්වාණ ධර්මය අවබෝධ කරගත හැකි යි.

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

# හෙට රට බබළවන මිණි මුතු



මහරගම සිරි වජිරඤාන දහම් පාසලේ
ප්‍රධානාචාර්ය
රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති
**හක්මන සුමනසිරි හිමි**

**ජීවන සටන ගෙන යාමේ කාර්ය බහුලත්වයත් සමඟ අපේ සමාජයේ බොහෝ මවුපියන්ට තම දරුවන් හා සමඟ කාලය ගත කරන්නට වේලාව අහිමි විය. වසර ගණනාවක සිටම මේ තත්ත්වය බරපතළ සමාජ ප්‍රශ්නයක් බවට පත්ව තිබුණි.**

එහෙත් දරුවන්ගේ ස්වභාවය,

වටිනාකම හොඳින් අවබෝධ කරගත් තවත් මවුපියවරු මොන තරම් කාර්ය බහුල තත්ත්වයක දී වුවද දරුවන් ගැන සොයා බලන්නට, ඔවුන් සමඟ ගත කරන්නට හැකි වන ලෙස වැඩ කටයුතු කළමනාකරණය කර ගත්හ. එයින් හැඟී යන්නේ නම් ඕනෑකම ඇති ඕනෑම කෙනෙකුට දරුවන් වෙනුවෙන් කැපකිරීම් කළ හැකි බව ය.

බෞද්ධ මවකට පියකුට ඇවැසි බෝසත් දරුවෙකි. ගුණධර්ම හඳුනන, යහපත් හැසිරීම් ඇති, ශික්ෂණයෙන් හෙබි සංවේදී දරුවෙකි. තවත් ලෙසකින් කියනවානම් නැණ ගුණ සපිරි පිරිපුන් දරුවෙකි. හෙට දිනයේ රට බබළවන්නේ ද මිණි මුතු වැනි එවැනි දරුවන් ම ය. ඔවුහු තමන්ට ද, අනුන්ට ද හිතකාමී වෙති. ගහට කොළට, සතා සීපාවාට ද රැකවරණය සලසති. මේ මිහිකත, වායුගෝලය, ජල සම්පත අපිරිසිදු නොකරති. ඒ නිසාම සුවසේ දිවි ගෙවති. ඔවුන් වෙනුවෙන් සොබා දහමද කිසිදු විටෙක උරණ වන්නේ නැත. මෙවැනි දරු පිරිසක් රටට දායාද කරන්නට නම් තමන්ගේ

දරුවන් හෙට දිනයේ සුවසේ ජීවත් වනු දකින්නට නම් වැඩ - වැඩ කියමින් වැඩ පසුම දිව යාම සුදුසු නැත. අප කැපකිරීම් කළ යුතුම ය. සියල්ල කරන්නේ, බොහෝ දෙනෙක් පවසන ලෙස දහ දුක් විඳින්නේ දරුවන් වෙනුවෙන් නම් දරුවාගේ සිරුර පෝෂණය කලාට ප්‍රමාණවත් නැත. අධ්‍යාපනය ලබා දුන්නාට ද ප්‍රමාණවත් නැත. සිරුරත් බුද්ධියත් පමණක් ජීවත්වීමට ප්‍රමාණවත් නැත. හදවත ද පෝෂණය කළ යුතු ය. ඒ තුළ ගරු කළ යුත්තාට ගරු කරන්නට, අසරණයන්ට පිහිට වීමට, වැඩිහිටියන්ට සැලකීමට, අනුන්ට කරදරයක් නොවන ලෙස ජීවත්වීමට, අනුන් වෙනුවෙන්, පරිසරය වෙනුවෙන් සංවේදී වීමට, කරුණාව මෛත්‍රීය වැනි සිතුවිලි ඇති කරවීමට ආදර්ශය දිය යුතුම ය. ඒ මවුපියන් විසිනි.

මේ දිනවල අම්මාට තාත්තාට දරුවන් වෙනුවෙන් වෙන් කරන්නට ඕනෑ තරම් කාලය ඇත. ඒ නිවසින් බැහැර නොවන නිසා ය. දරුවෙකුට ආදර්ශය දෙන්නට මේ කාලය තුළ නිසි ආරම්භයක් දීමට පුළුවන. දිනපතා දරුවන් සමඟ එක්ව බුද්ධ වන්දනාව සිදු කරන්න. ඒ සඳහා හොඳින් පිරිසුදු වී මල් නෙළාගෙන පහන් සුවඳ දුම් සූදානම් කරගෙන දරුවාත් සමගම එකට වන්දනාව සිදු කරන්න. ඒ සඳහා සූදානම් වීමේ සිටම දරුවාගේ සිතෙහි පහන් සිතුවිලි වර්ධනය වනු ඇත. ගාථා පාඨ දන්නේ නැතිනම් සුදුසු පොතක් බලාගෙන ගාථා කියන්න. මෙය දරුවාගේ ජීවිතයට ඉතා වටිනා පුරුද්දකි. මවුපියන් ක්‍රියාවේ නොයෙදී දරුවාට වැඩ පැවරුවද කිසිවිටෙකත් නිසි ප්‍රයෝජන ලැබෙන්නේ නැත. දරුවාගේ ස්වභාවය මවුපියන් අනුකරණයයි. එහෙයින් අවවාදයට වඩා ආදර්ශය වැදගත් ය. බුද්ධ වන්දනාවෙන් පසු භාවනාවකට යොමු කිරීම දරුවාගේ ජීවිතයට ඉතා ප්‍රයෝජනවත් ය. මෛත්‍රී භාවනාව, ආනාපානසති භාවනාව සුවිශේෂී ය.

> **දරුවාට පරිසරයට ආදරය කරන්න, එය රැකගන්න ආදර්ශය දීමට මේ අවස්ථාවම ආරම්භයක් කරගත යුතු ය. තථාගතයන් වහන්සේ අගය කළේ සරල ජීවිතයයි. උන් වහන්සේ අරපිරිමැස්ම අගය කළහ. අධි පරිභෝජනවාදය ප්‍රතික්ෂේප කළහ. අරපිරිමැස්ම යනු ලෝබකමවත් කුම්මැහිකමවත් නොවේ.**

අධ්‍යාපනය ලබන දරුවකුට නම්, ආනාපානසති භාවනාව පුරුදු පුහුණු කරවීම ඉතාමත් සුදුසු ය. ඒ මේ අත දුවන විසිරෙන සිත එක අරමුණකට රඳවා තබා ගැනීමයි ආනාපානසතියෙන් කියා දෙන්නේ. මෙහිදී සිදු කෙරෙන්නේ සමහර අය පුරුදුවී සිටින ලෙස ගැඹුරට හුස්ම ගැනීම නොවේ. මම සිහියෙන් යුතුව හුස්ම ඉහළට ගැනීම සිදුවන බව දනිමි. මම සිහියෙන් යුතුව හුස්ම පහළට ගැනීම සිදු වන බව දනිමි. නුවණින් දකිමි. යනුවෙන් භාවනා කළ යුතු වේ. මෙහිදී හුස්ම ඉහළට ගැනීම හුස්ම පහළට හෙළීම ඕනෑකමින් කරන්නේ නැත. ඉබේ සිදුවන සිදුවීම දෙස සිහි නුවණින් බැලිය යුතු ය. සාමාන්‍යයෙන් අපි උපන් මොහොතේ සිටම ආශ්වාස ප්‍රාශ්වාස කරමු. මේ භාවනාවේ දී දරුවෙකු විසින් කළ යුතු ගැඹුරට නොගොස් ඒ කෙරෙහි සිහිය යොමු කිරීමයි. බෝසත් දරුවෙක් පරිසරයට කිසිදු විටෙක වින කරන්නේ නැත. නුසුදුසු තැනක කෙළපිඬක් හෝ හෙළන්නේ නැත. කැළිකසල තැන තැන බැහැර කරන්නේ නැත. දරුවා ඒ ආදර්ශය ගන්නේ මව්පිය වැඩිහිටියන්ගෙනි. එහෙත් සමහර මවුපියන් දරුවන් සමඟම පැමිණ මහමඟ කැළිකසල විසුරුවා යන ආකාරය අපට අලුත් අත්දැකීමක් නොවේ.

අද අප මුහුණ දී සිටින භයානක වසංගත රෝග තත්ත්වය පරිසරය විනාශ කිරීමේ ප්‍රතිඵලයකි. මේ නිසා දරුවාට පරිසරයට ආදරය කරන්න, එය රැකගන්න ආදර්ශය දීමට මේ අවස්ථාවම ආරම්භයක් කරගත යුතු ය. තථාගතයන් වහන්සේ අගය කළේ සරල ජීවිතයයි. උන් වහන්සේ අරපිරිමැස්ම අගය කළහ. අධි පරිභෝජනවාදය ප්‍රතික්ෂේප කළහ. අරපිරිමැස්ම යනු ලෝබකමවත් කුම්මැහිකමවත් නොවේ. බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ තම පිඟානට ආහාර බෙදා ගන්නා විට දී පවා තමන්ට ප්‍රමාණවත් පරිදි බෙදා ගත යුතු බව ය. කෑම අනා පැත්තකට දැමීමට, විසි කිරීමට නොවේ. සකසුරුවම ඉතා වැදගත් ය.
එමෙන්ම මුදල් හරිහම්බ කිරීමට අම්මා තාත්තා දරන වෙහෙස අප්‍රමාණය.

එසේ ඉපයූ මුදලින් දෙන පොතපත,පෑන පැන්සල විනාශ කරනවා නම්, සකසුරුවමින් පරිහරණය නොකරනවානම් ඒ දරුවාගේ අනාගතය ද නාස්තිකාර ය. අද අපට කොරෝනා උවදුර පවා සකසුරුවම් විය යුතු බවට හොඳ පාඩමක් උගන්වා තිබේ. මේවා දරුවන්ට ඉගැන්විය යුතු ය. බලා හැදෙන්නට ආදර්ශය දිය යුතු ය. මවුපියන්ට තරම් තම දරුවන්ට මුළු හදවතින්ම ආදරය කරන සෙනෙහස තවත් දක්වන කෙනෙක් නැත. ඔවුන් දරුවන්ට ජීවිතය ගැන කියා දිය යුත්තේ තමන් ජීවිතයේ ලද අත්දැකීම් ද පදනම් කරගෙනය.

විවිධ අර්බුදවලට මුහුණ දුන් සැටි අර්බුදයන් පැන නැගුණු අවස්ථාවකදී බොහොම ඉවසීමෙන් කටයුතු කර සැනසීම ලද හැටි, ඒ සෑම දෙයක්ම දරුවාට කියා දිය යුතු ය. එවිට එය දරුවාගේ හදවතට දැනේ. එය වතාවත් දෙකක් නොව නිරන්තරයෙන් කළ යුතු දෙයකි. ඒ සඳහා හොඳ අවස්ථාවක් තෝරාගැනීම, දරුවා ඒ මොහොතේ සිටින ස්වභාවය හඳුනා ගැනීමට මවුපියන් දක්ෂ විය යුතු ය. එහිදී, එදා අපි මේ ගැටලුවලදී එකට එක ක්‍රියා කළා නම්, විරුද්ධව නැගී සිටියා නම්, නො සැලකිල්ලෙන් කටයුතු කළා නම්, අද අපට අත්වන ඉරණම අමුතුවෙන් කියන්න ඕනෑ නේද? ආදී ලෙස දරුවා සංවේදී වන ලෙස තමන්ගේ ජීවිතයට ද ඒ කරුණු වලින් ආදර්ශයක් උපදේශයක් ලබා ගැනීමට හැකිවන ලෙස පෙන්වා දිය යුතු ය. පෞද්ගලිකව තමන්ට, තමන්ගේ පවුලට, සමාජයට ඉදිරි ගමනක් තිබෙන්නේ යුතුකම් වගකීම් අනුව ය. තමන්ගෙන් තමන්ට ඉටුවිය යුතු කාර්යභාරයක් තිබේ.

හොඳ අධ්‍යාපනයක් ලැබීම, හොඳ ගුණධර්ම පුරුදු පුහුණු කිරීම, බුද්ධිමත් වීම ඒ අතර ප්‍රධාන ය.
ඒ වගේම තමන් මව්පියන්ට ආදී ලෙස විවිධ වයස්වලදී තමන්ගෙන් පවුලට, සමස්ත සමාජයට ඉටුවිය යුතු යුතුකම් තිබේ.
වගකීම් තිබේ. අද අපේ රටේ වුවද වැඩිහිටි නිවාස මොනතරම් තිබෙනවාද? ළමා නිවාස මොනතරම් තිබෙනවාද? තමන්ගේ යුතුකම් වගකීම් හරියට ඉටුවනවා නම් අසරණ මවුපියන් මහමඟට වැටෙන්නේ නැත.
මේ නිසා කුඩා කාලයේ සිටම තමන් යුතුකම් කරන ආකාරය වගකීම් ඉටුකරන ආකාරය අනුන් වෙනුවෙන් සංවේදී වන ආකාරය දරුවාට ඇසෙන්නට පෙනෙන්නට ආදර්ශය දිය යුතු ය. ඉහිරුණු කිරට හඬා පලක් නැති-වා සේ හැදිය යුතු වයසේ, හදාගත හැකි වයසේ දරුවන් නොහදා ඔවුන් වැඩිහිටියන් වූ පසු යහපත බලාපොරොත්තු වීම නම් ඵල රහිත ය. ඕනෑම දරුවෙක් බෝසත් දරුවෙක් බවට පරිවර්තනය කළ හැකි ය. ඒ කුඩා වයසේදීම ය. ඒ වගේම ආදර්ශයෙන් ම ය. විශේෂයෙන් තමන්ගේ ආගමානුකූලව දරුවාට ආදර්ශය දීම තුළ දරුවා විසින් අයහපත නිර්මාණය වන්නේ නැත.



**රමණී සුබසිංහ**

# ව්‍යසනයන්ගෙන් වැළකෙන පහසුම මඟ



**ලෝකයේ මිනිසුන් අතර විවිධාකාර හේතු සාදාගෙන දැවැන්ත යුද ගැටුම් ඇති වුණා. උදාහරණ ලෙස පෙන්වා දෙනවානම් I වැනි ලෝක යුද්ධය හා දෙවැනි ලෝක යුද්ධයත් කුරුස යුද්ධයත් පෙන්වා දෙන්න පුළුවන්.**

එහිදී විශාල වශයෙන් මිනිසුන් ඝාතනය වුණා. අද වුවද න්‍යෂ්ටික අවි පවා නිෂ්පාදනය කරනු ලබන බවත් අපට පෙනෙන්නට තිබෙනවා. ඒ අවශ්‍යතාව මත නොව තමන්ගේ බලපුළුවන්කාරකම් අනෙකාට පෙන්වීමටයි.

එහෙත් වසංගත රෝගී තත්ත්වයකදී, එසේත් නැත්නම් වයිරස ආසාදනයකදී මේ බලපුළුවන්කාරකම් සියල්ල යට වෙනවා.

එහිදී ජාතිය, ආගම්, කුල භේද උගත්, ධනවත් කිසිවකට යටත් නොවී එකම ආකාරයකට එහි බලපෑම එල්ල වන්නේ. මේ වන විට ලෝකයේ සිදුව ඇති ව්‍යසනයන්ගෙන් ඒ බව අපට පෙනී යනවා.

ස්වභාවික විපත්වලදී මෙන්ම මේ කොරෝනා ව්‍යසනයේදී ද සියලු දෙනාටම එකම ආකාරයේ විපත්තීන්ට මුහුණ දීමට සිදුව තිබෙනවා.

බුදු රජාණන් වහන්සේ විසින් අපට යහපත් දිවියකට කරුණු රැසක් අනුදැන වදළා. ඒ අනුව අප කටයුතු කරන්නේ නම් මේ ගැටලු අවම කර ගත හැකි වනවා.

විශේෂයෙන්ම එදිනෙදා කටයුතු කිරීමේදී අනුන්ට කරදරයක් නොවන ලෙසින් සිටින්නේ නම් සමාජ අර්බුද මතු වන්නේ නැහැ.

එහිදී බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලෝවාද සූත්‍රයේදී එක් එක් පුද්ගලයින්ගේ යුතුකම් මැනවින් දේශනා කර වදාළා. එහිදී තමන් විසින් අනෙක් අයට කළ යුතු යුතුකම් ඉටු කළ විටදී තමන්ට හිමි අයිතිවාසිකම් නිතැතින්ම ලැබෙන බවද උන් වහන්සේ පෙන්වා දුන් සේක.

එහෙත් වර්තමාන සමාජයේදී අපට එවන් තත්වයක් දක්නට අපහසුයි.

අද අපේ සමාජයේ සිටින බොහෝ අයගේ ක්‍රියාවන් මීට හාත්පසින්ම වෙනස්. විශේෂයෙන්ම ආපදා කළමනාකරණයේදී අපේ ජනතාවගේ සහාය බොහෝ වැදගත් වුවත් ජනතාව කටයුතු කරන්නේ වගකීම් හා යුතුකම් විරහිතවයි.

ඒ සඳහා ඕනෑතරම් උදාහරණ සැපයීමට පුළුවන්. සුනාමි ජල කඳ පැමිණ මුහුදට ඇදී ගිය පසු එය නැරැඹීමට ගොස් විපතට පත් වූවන් කොපමණ සිටියාද? එසේම නාය යෑම් සිදුවූ විට එම ප්‍රදේශ බලන්නට යන පිරිස කොතරම් සිටිනවාද? ගංවතුරක් ඇති වූ විට එහි ඔරු පදින්නට, එම ගංවතුර නරඹන්නට යන අය කොතරම් සිටිනවාද?

මේ අවස්ථාවේදීත් ආරක්ෂක අංශ හා සෞඛ්‍ය අංශ විසින් ලබා දෙන උපදෙස් අප පිළි නොපැදීම නිසා වන ව්‍යසනයන්, තමන්ටත්, තම පවුලටත් ගමටත් රටටත් අවසානයේ සමස්ත ලෝක ජනතාවටත් බලපාන බව පැහැදිලියි.

බුදුරජාණන් වහන්සේ ද ජීවක වෛද්‍යවරයා විසින් ලබා දුන් උපදෙස් පිළි පැදීම සම්බන්ධව අපට බෞද්ධ සාහිත්‍යයේ දක්නට තිබෙනවා.

මේ වංසගත තත්ත්වය යටතේ නිරෝධායන කටයුතුවලට ලක් වන්නට යැයි කියූ අය, එයට අවනත නොවී නිරෝධායනයට ලක් නොවී එය මඟ හැර සිටීමේ විපාක අද මුළු රටටම අත් විඳින්නට සිදුව තිබෙනවා.

බුදු රජාණන් වහන්සේ මෙවන් විපත් සඳහා ඖෂධ නියම කර නැතත් ඒවායින් වළකින අයුරු පැහැදිලිව දේශනා කර තිබෙනවා.

එමෙන්ම බුදු දහමත් හෙළ සංස්කෘතියත් එක්වූ අපේ බෞද්ධ සංස්කෘතිය අද බටහිර ජාතීන් පවා පිළි ගෙන තිබෙනවා.

ආචාර කිරීමේදී අතට අත දෙනවා වෙනුවට දෙඅත් එක්කර ආයුබෝවන් කියා

> “ දස රාජ ධර්ම හා සතර සංග්‍රහ වස්තු ඇතුළු ධාර්මික රාජ්‍ය නායකයකු විසින් අනුගමනය කළ යුතු, පිළිවෙත් නායකයන් කොතෙක් අනුගමනය කළද ජනතාව නිසි උපදෙස් පිළි නොපැද සිටියහොත් රට විනාශයක් කරා යැම වැළැක්විය නොහැකි වනවා. ”



මහාවිහාර වංශික
ශ්‍යාමෝපාලි මහා නිකායේ
ශ්‍රී රෝහණ පාර්ශ්වයේ
ප්‍රධාන සංවිධායක හා
විධායක කාරක සභික, ශාස්ත්‍රපති

**දොඩම්පහළ ශ්‍රී රාහුල හිමි**

ආචාර කරන්නට ලෝකයේ බොහෝ රාජ්‍ය නායකයන් පවා අද පුරුදුව සිටිනවා.

රෝගාබාධයකදී නිසි උපදෙස් පිළිපැදිය යුතු බවත් දස රාජ ධර්ම හා සතර සංග්‍රහ වස්තු ඇතුළු ධාර්මික රාජ්‍ය නායකයකු විසින් අනුගමනය කළ යුතු, පිළිවෙත් නායකයන් කොතෙක් අනුගමනය කළද ජනතාව නිසි උපදෙස් පිළි නොපැද සිටියහොත් රට විනාශයක් කරා යැම වැළැක්විය නොහැකි වනවා.

වර්තමානයේ පවත්නා රෝග අවදානම දුරු කර ගැනීම පිණිස ඒකාරාශී වීමෙන් වළකින ලෙස සියලුම රාජ්‍ය නායකයන් දන්වා සිටියද පසුගිය දිනක බංග්ලාදේශයේ ආගමික නායකයකුගේ අවමඟුල් අවස්ථාවකට ජනතාව අතිවිශාල පිරිසක් රැස්වී සිටි අයුරු අපට දක්නට ලැබුණා.

අපේ ආරක්ෂාව සලසා ගත යුත්තේ අප විසින්ම බව ඉතාම පැහැදිලියි.

එමෙන්ම රතන සූත්‍රය මෙරට විහාරස්ථානවල දේශනා කිරීම ඇරැඹීමත් සමඟම වර්ෂාව ඇතිවුණා. අපි රතන සූත්‍රයේ ආරක්ෂාව ගැනත් මෙහිදී අවධානය යොමු කළ යුතු වෙනවා.

අපේ රටේ මේ ව්‍යසනකාරී තත්ත්වය තවම වර්ධනය වී නැහැ. එය වර්ධනය කිරීම හෝ නොකිරීමේ වගකීම ඇත්තේ අප සතුවම බවද මෙහිදී සිහි තබා ගත යුතුයි.

අපට හෙළ සංස්කෘතියෙන් හිමිව ඇති බොහෝ ගුණාංග මෙන්ම බුදු දහමින් ලබා දී ඇති උපදෙස් නිසි ලෙසින් පිළිපදින්නේ නම් මේ රෝග බිය ඇතුළු සියලු දෙයින් මිදීම අපහසු වන්නේ නැහැ.

අතීතයේ සිට අද දක්වාම අපගේ නිවෙසක යම් බෝවන රෝගයකින් පෙළෙන අයකු සිටියහොත් නිවසට බාහිර පුද්ගලයින් පැමිණීම වැළැක්වීම පිණිස කොහොඹ අත්තක් නිවෙස ඉදිරිපිට එල්ලා තැබීම සිදු කළා. නිවැසියන්ද බැහැර ගියේ නැහැ. ඒ තමයි අපේ හෙළ නිරෝධායනය.

රටට ජනතාවට පමණක් නොව තම පවුලේ ඥාතීන්ට පවා ආදරයක් කරුණාවක් මෛත්‍රියක් නොමැති පුද්ගලයන්ට විරුද්ධව බුදු දහමේ වුවද දඬුවම් නියම කර ඇති බව පෙන්වා දිය යුතුයි.

එකම වරද දිගින් දිගටම සිදු කරන්නේ නම් ඒ සඳහා දඬුවම් තිබේ. බුදුරජාණන් වහන්සේ සමඟ (සිදුහත් කුමරා) අභිනිෂ්ක්‍රමණයට ගමන් කළ ඡන්න ඇමැති (පසුව ඡන්න භික්ෂුව) ආඩම්බරයෙන් උදුම් වී කටයුතු කිරීම නිසා අවසානයේ ඡන්න භික්ෂුවට බ්‍රහ්ම දණ්ඩය පවා පනවනු ලැබුවා.

පරිසරයට හානි කිරීමේ ප්‍රතිඵල අප අත්විඳින බව මේ වන විට සියලුම මාධ්‍ය මඟින් පෙන්වා දුන්නත් එම හානියේ වැඩිවීමක් මිස අඩුවක් දකින්න ඇත්තේම නැ.

එසේම දේශීය ඖෂධ පවා අප මේ වන විට සොයා යන්නේ ඇයි? අප හොඳින්ම දන්නවා එම ඖෂධයන්ගෙන් ශරීරයට ලැබුණු ඖෂධීය ගුණයන් ගැන.

විශේෂයෙන්ම වෙනිවැල්ගැට, කොත්තමල්ලි වැනි දේශීය ඖෂධවලින් අපට ඇති ගුණ අප හොඳින්ම දන්නවා. එසේම තුනපහ වැනි කුළුබඩු අප එදා සිටම නිසි පරිදි මාත්‍රා, පමණ දැන පරිභෝජනය කෙළේ ශරීරයට ප්‍රතිශක්තිකරණයක් පවා ලැබුණු නිසයි.

මේ සියලු කරුණු අනුව අපට වටහා ගත හැක්කේ දේශීයත්වයට නැඹුරුව අප කටයුතු කළ යුත්තාක් මෙන්ම අපට අදාළ අංශවලින් ලැබෙන උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු බවයි.

චීනයේ කොරෝනා වසංගතය පැතිර යද්දී ප්‍රතිකාර ලබා නොගත් අය සොයමින් හමුදාව ගෙයින් ගෙට යද්දි එය දුටු ශ්‍රී ලාංකිකයන් ඒ ගැන දුක් වූයේ එසේ ජනතාව රැගෙන යාම නොකළ යුතු බව පවසමින්.

එහෙත් අද අපේ රටේ එවැනි ලෙසින් ප්‍රතිකාර නොලබා නිරෝධායනය නොවී සිටින අය ගැන අප දරන මතය කුමක්දැයි යන්න අප සිතා බැලිය යුතුයි.

බුදුරජාණන් වහන්සේ කිසිදු විටක රාජ්‍ය පාලනයේ නීතිරීතිවලට එරෙහිව කටයුතු කෙළේ නැහැ. එබැවින් විශ්වීය දහමක් වන බුදු දහමින් මේ සියලු ව්‍යසනයන්ටන් හමුවේ නොසැලී සිටින්නට අපට උපදෙස් ලබා දී තිබෙනවා. අප කළ යුත්තේ මේ අවස්ථාවේදී ඒ සම්බන්ධව විශේෂ දැනුමක් ඇති අය ලබා දෙන උපදෙස් පිළි පැදීමයි.

**තාරක වික්‍රමසේකර**

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් -2429598, 2429429
ෆැක්ස් - 2429329, 2449069

වෙසක් පුර අටවක 2020-04-30

## ආකල්පමය වෙනසකට යා යුතු වේ

කොරෝනා උවදුරත් සමඟ අපේ සමාජයේ ඇතැම් කණ්ඩායම් තුළ වන තිරස්චීන ඇබ්බැහිකම් නිසා රටකට, සමාජයකට වන හානිය මොනතරම් ඛේදනීය ද යන්න අසන්නට දකින්නට ලැබෙමින් තිබේ.

විශේෂයෙන් මතට ඇබ්බැහිවූවන් නිසා රට රැක ගන්නට ඇප කැප වන ජාතියේ මුරදේවතාවන් පිරිසකට ද මේ භයානක වයිරසයට ගොදුරු වන්නට සිදු විය. කොරෝනා වෛරසය ව්‍යාප්තිය පාලනය කර ගෙන එමින් සිටි අවස්ථාවක එය විශාල සමාජ ප්‍රශ්නයක් බවට බවට පත් විය. අනතුරක භයානකත්වය දැකීමට, බාහිර සමාජය ගැන තබා තමන් ගැන, අඹු දරුවන් ගැනවත් සිතන්නට නොහැකි තරමට එහි ඇබ්බැහි වූවන් පහත් තත්වයට ඇද දැමීමට මත්ද්‍රව්‍ය බලවත් වී තිබේ.

බුදුරජාණන් වහන්සේ ගිහියාට අනුදැන වදාළ පංච ශීල ප්‍රතිපදාව තුළ මත් ද්‍රව්‍ය භාවිතයෙන් වැළකිය යුතු බව දේශනා කොට වදාළේ එයින් පෞද්ගලිකව තමන්ටත්, පොදුවේ සමස්ත සමාජයටත් සිදුවන හානිය බරපතළ වන නිසාය. එය අපට ඇස් පනාපිටම පෙනෙන්නට තිබේ. එහෙත් මතට ඇබ්බැහි වූවන් සහ ජාවාරම්කරුවන් යහමඟට ගැනීම නම් ඉතා අසීරුව ඇති බව පෙනේ.

මේ දිනවල කොරෝනා උවදුර මඬින්නට කාලයත්, ශ්‍රමයත්, කැප කරන ආරක්ෂක අංශවලට ජන සමාජයේ විනය ශික්ෂණය ගොඩනගන්නට ද සිදුව තිබේ. එක් පැත්තකින් නීති විරෝධීව, හොර රහසේ නිවෙස් තුළ මහ කැලෑවල නිෂ්පාදනය කරන මත් ද්‍රව්‍ය හා අදාළ පුද්ගලයන් මහා පරිමාණ ජාවාරම්කරුවන් වැටලීමට සිදුව ඇත. ඒ සමාජ ආරක්ෂාව සඳහා ය. අනෙක් පැත්තෙන් රටේ නිෂ්පාදන ක්‍රියාවලිය අක්‍රිය වුවත් වයිරස ව්‍යාප්තිය වැළැක්වීම සඳහා පැනවූ ඇඳිරි නීතිය කඩ කරන්නන් අත්අඩංගුවට ගැනීමට ය. එසේ අත් අඩංගුවට පත්වන්නන් ද බොහෝ ය. නීතියට ගරු කරන්නට කීකරු වන්නට ද ඇතැමුන්ට ඉගැන්වීමට සිදුව තිබේ.

මෙවන් භයානක උවදුරකදී රටේ ආරක්ෂක අංශ, සෞඛ්‍ය ක්ෂේත්‍ර හා රාජ්‍ය නායකත්වයේ ශක්තිමත් මැදිහත්වීම තුළ අපට තවමත් ජීවිත ආරක්ෂා කර ගැනීමට හැකිව තිබේ. ඒ ලොව බලවත් රටවල දහස් ගණනින් මිනිසුන් මරණය වැළඳ ගන්නා අතරතුර දී ය. අපේ මිනිසුන් තුළ හොඳ විනයක් හික්මීමක් තිබුණා නම්, අවනත වීමේ ස්වභාවයක් තිබුණා නම්, මේ තරම් වත් රෝගයට ගොදුරු නොවන්නට තිබුණි.

අපේ මිනිසුන් තුළ විනය, හැදියාව, ශීලාචාරකම ඇති වන තාක්, ආකල්පමය වෙනසක් ඇති වන තාක්, රටක් ජාතියක් ලෙස නැගී සිටින්නට නොහැකි වනු ඇත. එවන් අශීලාචාර එක් අයෙක් වුවද රටක් විපතේ හෙළන්නට ප්‍රමාණවත් වන බවට කොරෝනා උවදුර අනතුරු හඟවා තිබේ. කොරෝනා නොව වෙනයම් උවදුරකදී ද මේ තතත්වය එලෙසම ය.

එහෙයින් යහපත් සිතුවිලි ගොඩ නැගීමේ ශක්තිමත් වැඩ පිළිවෙලකට යා යුතුව තිබේ. එය කුඩා දරුවාගේ සිට වයෝවෘද්ධ පුද්ගලයා දක්වාම සිදුවිය යුත්තකි. ඈත දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල සිට මහා ගම් නගර දක්වාම සිදුවිය යුත්තකි. තවත් ලෙසකින් කියනවානම් රටේ අස්සක් මුල්ලක් නෑර ම සිදුවිය යුත්තකි.

කොරෝනා වයිරස ව්‍යාප්තියත් සමග මේ රට ගොඩ නගන්නට, සෞභාග්‍යමත් කරන්නට ඕනෑ කම ඇති හැකියාව ඇති ශක්ති සම්පන්න මිනිසුන් බොහෝ සිටින බව අපට දැකගන්නට ලැබුණි.

කුඩා දරුවාගේ සිට ම විවිධ නිර්මාණ බිහිවුණි. මහා පිරිවැයක් දැරිය යුතු තාක්ෂණික මෙවලම් අඩු පිරිවැයකින් නිර්මාණය වුණි. නව සොයාගැනීම් බිහි වුණි. මුඩුබිම් බොහොමයක් අස්වැද්දුණි. බොහෝ නිවෙස්වල කුඩා ගෙවත්ත ද එලවළු පලතුරුවලින් සාරවුණි.

රාජ්‍ය නායකත්වය තුළ ලැබෙන ආදර්ශයත් අගය කිරීමත් උනන්දු කරවීමත් ඊට බලපෑ ප්‍රධාන කාරණයකි.

අපට බොහෝ දේ කළ හැකි ය. ඒ සඳහා ආකල්පමය වෙනසක් ඇවැසි ය. ඒ වෙනසට ශක්තිමත් වැඩපිළිවෙළක් ඇවැසි ය.

# සසුන් කෙත සුරකින කැඩපත



කැලණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ
මහාචාර්ය
**මකුරුප්පේ ධම්මානන් ද හිමි**

**ලොව්තුරා බුදුරජාණන් වහන්සේ, ශ්‍රී සද්ධර්මය සහ ආර්යය මහා සංඝරත්නය යනු ත්‍රිවිධ රත්නයෝ ය. අප දිනපතා සජ්ඣායනය කරන රතන සූත්‍රයෙහි මෙම රත්න තුන හා සමාන රත්නයන් ලෝකයෙහි අවිද්‍යමාන බව සඳහන් වේ.**

ශ්‍රී ලංකාව වූකලී බාහිර වශයෙන් පලිඟු, වෛඩූර්ය ආදී භූමිගත රත්නයන්ගෙන් ද, ආධ්‍යාත්මික වශයෙන් ඉහත කී ත්‍රිවිධ රත්නයන්ගෙන් ද සමන්විත දේශයකි. එසේම අනේකවිධ දෙවි දේවතාවන්ගේ ද රැකවරණයෙන් සුරක්ෂිත මෙම දේශය බටහිර සංස්කෘතිය වැළඳ ගැනීම් හේතුවෙන් අනුක්‍රමයෙන් ව්‍යසනය කරා ගමන් කළ අයුරු ද අප දුටු සත්‍යයකි. ලෝක නීතිය හා ධර්ම නීතිය මායිම් නොකරමින් ජීවිතය ජය ගැනීමට උත්සාහ දරන ගිහි සමාජයක් මෙන්ම පැවිදි සමාජයක් ද ඒ අනුව නිර්මාණය විය. ලෝකයටම පොදු වූ මෙම තත්ත්වය මත ස්වභාව ධර්මයට මෙන්ම සතා සිවුපාවට ද සිදු වූයේ අපමණ හිරිහැරයකි. එහෙයින්ම ලෝකයේ මිනිස් ප්‍රජාව ලක්ෂ සංඛ්‍යාත ගණනින් ඉමහත් හිරිහැර හා ව්‍යසනවලට පත්වී සිටිති.

මෙම තත්ත්වය යටතේ බුදුදහම සුරකින ජාතියක් වශයෙන් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා වශයෙන් සිව්වැදෑරුම් වන බෞද්ධ සමාජය සතු පරමාදර්ශී කාර්යභාරයක් වේ. ඒ සඳහා කළයුතු වන්නේ ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනයේ නිරුපද්‍රිත පැවැත්ම සඳහා කළ හැකි දේ කිරීමයි. ස්වයං විවේචනය නමැති කැඩපත ඉදිරියෙහි පරීක්ෂාවට ලක්වීම මේ සඳහා අප විසින් කළ යුතු පළමු කාර්යභාරය වේ. එම කැඩපත ඉදිරියෙහි පෙනී සිටිහොත් ය. අප බොහෝ දෙනෙකු තුළින් දැකගත හැකි වන්නේ උඩඟුකම නමැති ප්‍රතිරූපයයි. සැබැවින්ම එය ප්‍රතිරූපයක් නොව අවතාරයකි. එය ඔබගේත් මගේත් ප්‍රතිරූපය වියහැකි දැයි සිතා බැලීම සුදුසු ය.

වර්තමාන ශාසනික චර්යාව තුළ උඩඟුකම ප්‍රබල ගැටලුවක් බව අමුතුවෙන් කිවයුතු නැත. නිරායාසයෙන් ලැබෙන අධික ලාභ සත්කාර, ධනය, ගරු බුහුමන්, සුවිසල් මැඳුරු ආදිය හේතුවෙන් එකිනෙකා ඉමහත් ලෙස උඩඟු වී සිටිති. එබැවින්ම ඔවුහු බෞද්ධ සමාජය තුළ පැවති වැඩිහිටියන් විෂයෙහි වැඳීම් පිදීම්, දැක හුනස්නෙන් නැගිටීම්, ගරු බුහුමන් කිරීම්, සතුටු සාමීචියෙහි යෙදීම්, අනෙකාගේ දුකෙහි දුක්වීම් ආදී මනුෂ්‍ය සාරධර්ම නොතකා හරිති. බුදුන් වහන්සේ අනුදැන වදාළ සීලමය සංවරය ජීවිතයේ පදනම සේ නොතකා කටයුතු කරති. තවද මෙම උඩඟුකම කෙතරම් බලගතු වී ඇද්ද යත් ඇතැම්හු අනාගත වක්තෘවරයෝ ය. තමාට ඉහළින් වෙනත් කෙනෙකුන් නැති බවත් තමන් ගනුදෙනු කරනුයේ දෙවියන් සමඟ පමණක් බවත් කියති වදාරති.

ඇතැම්හු ගෞතම බුදුරදුන්ටත් ඉහළින් සිටින බුදුවරුන් සේ පෙනී සිටිති. මෙම ඛේදවාචකය යටතේ අපට කළ හැක්කේ කුමක් ද? දරුණු මානසික ව්‍යාධියකින් පෙළෙන සමාජ මඩ ගොහොරුවකට අප වැටී ඇති බව ඉතා පැහැදිලි ය. එසේනම් මෙවන් පසුබිමක ශාසන හිතකාමී මිනිසුන් විසින් කළ යුතු පළමු කාර්යයක් වන්නේ මමත් එම ව්‍යාධියෙන් පෙළෙන්නෙක් දැයි ස්වයං විවේචනයක යෙදීමයි.

දෙවන කරුණ වන්නේ වන්දනා මානයන්හි යෙදීමයි. භෞතික ලෝකය පිළිබඳව ඉගෙනුම ලබන අපගේ උගත්කම අප මිථ්‍යාවෙහි ගිල්වා ඇත. දැනුමෙන් සියල්ල කළහැකි යැයි සිතන සමාජයක් නිර්මාණය වී ඇත. එනිසාම ගුරු දෙගුරුන්ට පමණක් නොව බුදු රජාණන් වහන්සේටවත් වැඳීම අත්‍යවශ්‍ය කරුණක් නොවන බව ඇතැම්හු සිතති. පැරණි යතිවරයන් වහන්සේලා දිනකට පැය දෙකක් තරම්

> අප බොහෝ දෙනෙකු තුළින් දැකගත හැකි වන්නේ උඩඟුකම නමැති ප්‍රතිරූපයයි. සැබැවින්ම එය ප්‍රතිරූපයක් නොව අවතාරයකි. එය ඔබගේත් මගේත් ප්‍රතිරූපය වියහැකි දැයි සිතා බැලීම සුදුසු ය.

කාලයක් බුද්ධ වන්දනාව සඳහා කැප කළහ. එහෙත් අද ඇතැම් වෙහෙර විහාරවලින් පවා එම උතුම් පිළිවෙත බැහැර වී ඇති බව සංවේගයෙන් වුවත් කිව යුතුව ඇත. වාසනාවකට මෙන් ඇතැම් යතිවරු දැනට ද මෙය ඉටු කරති. එබැවින් අප යළි යහපත් අනාගතයකට පිය මනින්නේ නම් උතුම් බුද්ධ පුත්‍රයන් වහන්සේලා විසින් කරනු ලබන මෙබදු සත් චාරිත්‍ර ඉමහත් ශ්‍රද්ධාවෙන් යුතුව වඩා වර්ධනය කළ යුතුව ඇත. කුමක් නිසාද යත් ශ්‍රද්ධාව අපගේ මනුෂ්‍යත්වය ආරක්ෂා කරන ප්‍රධාන ගුණාංගය වන හෙයිනි.

තථාගතයන් වහන්සේ දැකීම තෙවැන්නයි. මහණෙනි, 'යමෙක් ධර්මය දකින්නේ නම්, ඔහු මා දකින්නෙකි' යැයි වරක් බුදුන් වහන්සේම පැවසූහ. ඒ අනුව බෞද්ධ ශ්‍රාවකයා නිබඳවම තථාගත ධර්මය හදාරා එය තේරුම් ගෙන ඒ තුළින් තථාගත බුදුපියාණන් වහන්සේ දැක ගැනීමට වෑයම් කළ යුතු ය. විශේෂයෙන් සංඝ සංස්ථාව නියෝජනය කරනු ලබන බුද්ධ පුත්‍රයන් වහන්සේ නමක් නම් තමා තථාගත ධර්මය ඇතුළත් ත්‍රිපිටකය කියවන්නෙක් දැයි ස්වයං විවේචනයක් කළ යුතු ය. එසේ නොමැත්තේ නම් එය ජීවිතයේ විශාල අඩුවක් බව තේරුම් ගත යුතු ය. තථාගත ධර්මය නො හැදෑරීමෙන් ලබන දැනුම ධර්මයෙන් ප්‍රතිබල සම්පන්න නො වූවකි. යමෙක් එසේ බුද්ධ වචනය නොදන්නේ නම්, ඔහු දන්නේ ලෙනින්, ඇරිස්ටෝටල්, මහත්මා ගාන්ධි, ෂේක්ස්පියර් හෝ එබඳු වෙනත් යමෙකුගේ දේවල් පමණක් නම් ඔහු බුද්ධ වචනය දෙසීමට හෝ ඊට විවරණ සැපයීමට සුදුස්සෙක් ද නොවේ. එබැවින් ශ්‍රී ලංකාවේ ශාසනික උන්නතිය සඳහා කැප වූ යම් ගිහි වූ හෝ පැවිදි වූ හෝ ස්ත්‍රී වූ හෝ පුරුෂ වූ හෝ ශ්‍රාවකයෝ වෙත් නම් ඔවුහු ත්‍රිපිටක බුද්ධ වචනය මැනවින් හැදෑරීමට උත්සුක වෙත්වා.

සිව්වැන්න මිථ්‍යා ආජීවයෙන් ඉවත්වීමයි. මෙය වෙනත් විධියකින් කිවහොත් බුදුරදුන් අකැමැති අනුමත නොකළ දේ නො කර සිටීමයි. හොරකම හා බොරුව මූලික කොටගෙන සමාජයේ බොහෝ අය බොහෝ තිරශ්චීන විද්‍යාවන්ගෙන් ජීවනෝපාය සලසා ගනිති. පුද්ගල ප්‍රතිරූප සාදා ගනිති. මෙය ආත්ම වංචාවක් මෙන්ම සමාජ අපරාධයක් වේ. එබඳු ජීවිත ඇති පුද්ගලයන් වෙතින් සම්බුද්ධ ශාසනය එළියක් නො ලබයි. හුදෙක් ඔවුහු සම්බුද්ධ ශාසනය කෙළෙසන්නෝ ය. වැරදි පූර්වාදර්ශ සැපයීමෙන් පශ්චාත් සමාජය නොමගට හෙළන්නෝ ය. මෙය මෙලොව වශයෙන්ම තමා අපාගතවීම සඳහා සයනය කිරීමට අවශ්‍ය තම මිනී වළ හාරා ගැනීමක් බඳු ක්‍රියාවකි. තමන්ගේ ජීවිතයට වචනයට හා ක්‍රියාවට වටිනාකමක් දිය නොහැකි මිනිසෙකුට සම්බුද්ධ ශාසනයට ආලෝකයක් සැපයිය නොහැකි බව ද තේරුම් ගත යුතු කරුණකි.

බුදු දහම වූකලී අනන්ත අපරිමාණ ව්‍යසනයන්ගෙන් පෙළෙන ලෝකයට නිසැක ශාන්තියක් වන දහමක් බැවින් බුදු දහම සුරැකීම විෂයෙහි අපගේ යුතුකම නිසි පරිදි ඉටු කරමු. එම අදහස මුදුන් පමුණුවා මානසික දරදඬු භාවයෙන් නිදහස්ව පළමුව තමා තේරුම් ගැනීම සඳහා ඉහත දැක්වූ කරුණු ආශ්‍රයෙන් ස්වයං විවේචනයක නිරත වන්නේ නම් ඔබ සත්පුරුෂ මිනිසෙකු වනු නො අනුමාන ය.

# නායකත්ව ලක්ෂණ හඳුනා ගනිමු



අනුරාධපුර
ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයේ
බෞද්ධ හා පාලි අධ්‍යයන අංශයේ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
**පාතේගම ඤාණිස්සර හිමි**

**නායකයකු සතු විය යුතු සුවිශේෂී ලක්ෂණ පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ නළපාන ජාතකයේ දී දේශනා කර තිබෙනවා. එම ජාතක කතාවේ සඳහන් වන ආකාරයට, එක්තරා වඳුරු රංචුවක්, තමන්ට නුහුරු නුපුරුදු දිශාවකට ගමන් කරමින් සිටි අවස්ථාවක දිය පිපාසාවෙන් පෙළෙමින් සිටි ඔවුනට එම ප්‍රදේශයේ තිබෙන විලක් හමුවුණා.**

දිය පිපාසාවෙන් සිටියත්, නිසල දිය පිරී තිබුණත්, තමනට නුහුරු නුපුරුදු පරිසරයක් වූ නිසාම එහි ඇතැම් විට අනතුරක් තිබිය හැකි බවට නායකත්වය සෙසු පිරිසට උපදෙස් ලබාදීමට කටයුතු කළා.

මෙය නායකයකු තුළ තිබිය යුතු දූරදර්ශී ඥාණයක් ලෙස පෙන්වන්න පුළුවන්. එවැනි ආකාරයේ ප්‍රකාශයක් කිරීමෙන් පමණක්, එම නායකත්වය සෑහීමකට පත් වුණේ නැහැ. දිය පිරුණු පොකුණ අනතුරක් තිබෙනවාද? යන වගත්, විමසා බැලුවා. ඒ ආකාරයෙන් නිවැරැදිව සුපරීක්ෂාකාරීව බලන විට පොකුණට බසින ලද පිරිසකගේ පා සටහන් තිබෙන බවත්, පොකුණ තුළින් නැවත ගොඩට පැමිණි කිසිවෙකුගේ පා සටහන් නොමැති බවත්, ඔහුට දක්නට ලැබුණා.

ඔහුගේ අනුමානය නිවැරැදි බව තේරුම් ගැනීමෙන් අනතුරුව අසල ප්‍රදේශයේ තිබූ උණ ගස්වල පුරුක් ඔහුගේ අධිෂ්ඨාන බලයෙන් ඉවත් කරගෙන ජල පිපාසාව සන්සිඳුවා ගනිමින්, ඔවුන්ගේ ජීවිත බේරා ගනිමින් සතුටින් පිටත්ව ගියා. නායකයකු තුළ තිබිය යුතු එක්තරා සාධනීය සුභ ලක්ෂණයක් මෙම ජාතක කතාවෙන් විවරණය වෙනවා. තමා නායකත්වය දරන පිරිස බේරාගැනීම, එම පිරිසට අනතුරක් වීමට ඉඩ නොතැබීම, පිරිස පරාජයට පත් නොකිරීම, පිරිස අතර සිටි පිරිස් මරණයට පත් නොකිරීම යන ලක්ෂණ බුදු දහමට අනුව නිවැරැදි නායකයකු තුළ තිබිය යුතු ලක්ෂණ ලෙස සඳහන් වෙනවා. ඇතැම් නායකයන් යැයි කියාගන්නා පුද්ගලයන් තුළ මෙයට වඩා වෙනස් ගතිගුණ තිබිය හැකියි. ඒවා බුදු දහමට අනුව නායකත්ව ලක්ෂණ ලෙස දක්වන්නේ නැහැ

නායකත්ව ලක්ෂණය විය යුත්තේ තමනට පැවැරුණු වගකීම, වගවීම නිවැරැදිව සිදු කිරීමයි. එබඳු බොහෝ අවස්ථාවන් ජාතක පොතේ සඳහන් බුද්ධ දේශනා තුළින් පැහැදිලි කර ගත හැකියි. ඒ වගේ අත්දැකීම් අපගේ වර්තමාන සමාජය තුළ වුණත්, මෙම කාලය තුළ අත්විඳීමට, අත්දැකීමට පුළුවන්. නළපාන ජාතකයේ සඳහන් වන නිවැරැදි නායකත්වය වගේම වර්තමාන ශ්‍රී ලාංකේය නායකත්වය, රට ගැන සිතන බවත්, තමන්ට පැවරුණු වැඩ කොටස නිවැරැදිව ඉටුකරන ස්වභාවයත් අපට වර්තමාන සමාජය තුළින් දකින්න ලැබෙනවා. බුදු දහමට එකඟ නායකයකු තුළ තිබිය යුතු ලක්ෂණ සමූහය අතුරින් එය එක ලක්ෂණයක්.

ඒ වගේම ජාතක කතා පොතේ ඇතුළත් බොහෝ ජාතක කතා තුළින් මෙවැනි ආකාරයෙන් කාලීන සමාජයට ගත හැකි ආදර්ශ බොහෝ සේ දකින්න පුළුවන්. වන්ණුපථ ජාතකයත් එබඳුම ආකාරයේ කතාවක්. එම කතාවේ සඳහන් වෙන ආකාරයට කාන්තාරයක ගමන්කරමින් සිටි වෙළෙඳ පිරිසක් අතරින් පළමුවෙන් ගමන් කළ ගැල්කරුගෙන් සිදුවුණු අත්වැරැදීමක් හේතුවෙන් ජලය හිඟකමින් සියලු දෙනාම මරණය වැළඳගැනීමට සිටි මොහොතක එම නායකත්වය උදෑසනම අවදිවෙලා

> ‘ නිවැරැදි නායකයා තමන්ටත් අනුන්ටත් සේවය කරන්නෙක්. එය සිදු කළ හැක්කේ උත්සාහශීලී, අධිෂ්ඨානශීලී පුද්ගලයාට පමණයි. තමාගේ දියුණුවක් නැති පුද්ගලයකුට පොදු සමාජයේ දියුණුවක් ඇති කළ හැකි ස්වභාවයක් බුදු දහමේ පෙන්වා දෙන්නේ නැහැ. ’

කාන්තාරයේ වටපිටාව පරීක්ෂාවට ලක්කර තිබෙනවා. එම අවස්ථාවේ මනාව වැඩුණු ඊතණ පඳුරක් දකින්න ලැබීමත් සමඟ එම ස්ථානයේ ජලය තිබිය හැකි බවට ඔහු අනුමාන කළා. උත්සාහවන්ත වූ එම පිරිස පොළොව හාරාගෙන ඉදිරියට ගමන් කරන විට ජලය වෙනුවට විශාල කළු ගලක් මතුවුණා. තමා ගත් උත්සාහය අතහැරීමට අකමැති වූ නිසාම තවදුරටත් පොළොව හාරාගෙන මහා කළු ගල කඩාගෙන ඉදිරියට ගමන් කළ එම පිරිසට උල්පත් රාශියකින් මහා ජල කඳක් මතුවුණා.

එම වෙළෙඳ පිරිස ඔවුන්ට රිසි ආකාරයට ජලය පානය කරමින් එම ස්ථානයේ කොඩියක් ද එල්වා තබමින් ඔවුන්ගේ සුපුරුදු ගමන ආරම්භ කළා. නායකත්වය තුළ තිබිය යුතු අධිෂ්ඨානශීලී බව එම ජාතක කතා පුවතෙන් විවරණය වෙනවා. ඒ වගේම නිවැරැදි අනුමානය දකින්න පුළුවන්. සැම විටම අනුමානය සත්‍යය නොවුණත්, අනුමානය තුළ සත්‍යය සොයාගත හැකි අවස්ථා තිබෙනවා. නිවැරැදි අනුමානය නිසා එම පිරිස ජීවිතයත් බේරාගෙනම, අන්‍යයාගේත් පරාර්ථය පිණිස යහපතක් කළා. ජලය තිබෙන ස්ථානයේ කොඩියක් එල්වා යාමට තරම් ඔවුන් කාරුණික වුණා. ජාතක කතා පොතේ සඳහන් වන්නේ අත්තහිත පරහිත යන සංකල්පයයි. උත්සාහශීලී, අධිෂ්ඨානශීලී පුද්ගලයා විසින් තමාගේ අර්ථය සාධනය කරගන්නවා වගේම අන්‍ය පුද්ගලයාගේත් යහපත පිණිස වැඩකටයුතු සිදු කරනවා. ලෝකයේ ජීවත් වන පුද්ගලයන් විවිධයි.

තමාගේ හිතසුව පිණිස කටයුතු කළත්, අන්‍යයාගේ හිතසුව පිණිස කටයුතු නොකරන පිරිසත්, තමන්ගේ හිතසුව පිණිසත්, අන්‍යයාගේ හිතසුව පිණිසත් කටයුතු නොකරන පිරිසත් දකින්න පුළුවන්. ඒ වගේම අන්‍යයාගේ හිතසුව පිණිස කටයුතු කළත්, තමාගේ හිත සුව පිණිස කටයුතු නොකරන පිරිසත්. තමාගේ හිත සුව පිණිසත්, අන්‍යයාගේ හිත සුව පිණිසත් කටයුතු කරන පිරිස වශයෙන් පුද්ගලයන් විවිධාකාරයෙන් දකින්න පුළුවන්.

නිවැරැදි නායකයා යනු මින් හතර වන කොටසට අයත් වන පුද්ගලයායි. නායකයාටත් කටයුතු කරගැනීම අවශ්‍යයි. ඒ වගේම අන්‍යයාටත් පොදු සමාජයටත් කටයුතු කළ යුතුයි. තමාගේ දියුණුවක් නැති පුද්ගලයකුට පොදු සමාජයේ දියුණුවක් ඇති කළ හැකි ස්වභාවයක් බුදු දහමේ පෙන්වා දෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය අවබෝධ කරගෙන සමාජයට නිවැරැදි මග දේශනා කළ විශිෂ්ට නායකයෙක්. විවේක බුද්ධියෙන් මැදිහත්ව බලන පුද්ගලයකුට වර්තමාන ශ්‍රී ලාංකේය නායකත්වය තුළත්, එම නායකත්ව දර්ශනය දකින්න ලැබෙනවා. විවේක බුද්ධියෙන් මැදහත්ව නොබලන පක්ෂ පාතිත්වයෙන් බලන පුද්ගලයකුට එම බැල්මේ තිබෙන පක්ෂ පාති බව නිසා සත්‍යය එලෙසම නොපෙනෙන්න පුළුවන්. කිසියම් පුද්ගලයකුට පවත්නා සත්‍යය එලෙස දැකිය හැකි නම්, එයත් පුද්ගල පෞරුෂත්වයේ සාධනීය ලක්ෂණයක් හැටියට පෙන්වන්න පුළුවන්.

**හේමමාලා රන්දුනු**



# ආධ්‍යාත්මික සාමය හා සමාජ සාමය



කොළඹ - 07
නාරද බෞද්ධ ධර්මායතනාධිපති,
ශාස්ත්‍රපති, රාජකීය පණ්ඩිත
**තලල්ලේ චන්දකිත්ති හිමි**

**බුදුරජාණන් වහන්සේ කියන්නේ කවරෙකුටදැයි සොයන්නෙකුට ත්‍රිපිටකාගත සූත්‍ර දේශනාවලින් ඒ සඳහා අවශ්‍ය කරුණු රැසක් සොයා ගත හැකියි. අපි මෙහි දී බලාපොරොත්තු වන්නේ මධුපිණ්ඩික සූත්‍රයද ඇසුරෙන් බුදුපියාණන් වහන්සේ යනු කවුරුන්ද යන පැනයට පිළිතුරු සැපයීමයි.**

දිනක් බුදුපියාණන් වහන්සේ කිඹුල්වත් නුවර මහාවනය නම් ස්ථානයෙහි විවේකයෙන් වැඩ සිටියා. දණ්ඩපාණී නම් ශාක්‍ය වංශිකයෙක් එතැනින් ඇවිද ගෙන යන්නට පැමිණියා. බුදුපියාණන් වහන්සේ දුටු දණ්ඩපාණී බුදුපියාණන් වහන්සේ වෙත පැමිණ උන් වහන්සේට ගරු සැලකිලි නොදක්වා 'ශ්‍රමණ භවද් ගෞතමයාණන් වහන්සේ කුමක් කියමින් තැන තැන ඇවිදින්නේ' දැයි විමසුවා. එවිට බුදුපියාණන් වහන්සේ ඔහුට දුන් පිළිතුරුවලින් බුදුපියාණන් වහන්සේ යනු කවරෙක් ද, කුමක් කරන්නෙක් දැයි අපට වටහා ගත හැකි වෙනවා.

මෙහි දී බුදුපියාණන් වහන්සේ තමන් කවුදැයි යන්න කාරණා පහකින් විස්තර කර දෙනවා.

තමන් වහන්සේ ලෝකයෙහි කිසිවෙකුත් හා සමගින් පැටළෙන්නේ නැති බවත් (න කේනචි ලෝකේ විග්ගයිහ තිට්ඨති ) විචිකිච්ඡා සහගත ව කුතුහලයෙන් යුක්ත ව කටයුතු නොකරන බවත්, සිඳ දමන ලද කුකුස් ඇති ව කටයුතු කරන බවත්, තණ්හාව නැති කළ බවත්, හඳුනා ගන්නා අරමුණු නිසා සිතෙහි කෙලෙස් තැන්පත් කර ගන්නේ නැති බවත්, ඒ අරමුණු නිසා කෙලෙස් අවුස්සා ගන්නේ නැති බවත් පැහැදිලි කර තිබෙනවා.

මේ අනුව බුදුපියාණන් වහන්සේ කිසිවෙකුත් සමඟින් ගැටෙන්නේ නැති, අවිහිංසාවාදී උත්තමයෙකි. යමෙක් යමෙකු සමඟ ගැටීමක් ඇති කර ගන්නේ නම් ඒ තැනැත්තා සිතෙහි ද්වේශය ඇති ව කටයුතු කරන්නෙකි. ද්වේෂය නැමැති අකුසල මූලය ගැටෙන පැටලෙන අයගේ සිතෙහි ඇතිවන සිතිවිල්ලකි. බුදුපියාණන් වහන්සේ කා සමගින්වත් ගැටෙන්නේ නැහැ යන ප්‍රකාශයෙහි ගම්‍යාර්ථය වන්නේ බුදුපියාණන් වහන්සේ ද්වේෂය නැති කළ බවයි. ද්වේෂය නැති කළ බුදුපියාණන් වහන්සේ අපට දේශනා කරන්නේ ද ද්වේෂය නැති කර ගන්නා ලෙසයි.

සත්ත්වයා බාහිර සමාජයට ප්‍රචණ්ඩත්වය හෝ දුරාචාරය මුදාහරින්නේ ආධ්‍යාත්මික ව අසරණ වූ විටයි. තමන්ගේ සිතිවිලි පාලනය කර ගැනීමට තමන්ට ම නොහැකි වූ විටයි. ආධ්‍යාත්මික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වෙන තැනැත්තා තරහාදී නරක සිතිවිලි මගින් පළමුව තමන් පීඩාවට පත්වෙමින් අනුන ද පීඩාවට පත්කරවයි. සත්ත්වයා කයින් සහ වචනයෙන් සමාජගත කරන දුරාචාරය පාලනය කර ගැනීමට නම් පළමු ව සිත පාලනය කර ගත යුතු බව වටහා ගත් බුදුපියාණන් වහන්සේ ද්වේෂය පාලනය කර ගැනීමට අපට උපදෙස් දුන්නා.

බුදුපියාණන් වහන්සේ කුතුහලයෙන් යුක්තව කටයුතු කළ කෙනෙක් නොවෙයි. එසේ කටයුතු කළ හැකි වන්නේ කාමයන්ගෙන් විසංයුක්තව කටයුතු කරන කෙනෙකුට පමණයි. සාමාන්‍යයෙන් මිනිසා අනුන්ගේ තොරතුරු දැනගැනීමේ ආශාවකින් යුක්තවයි කටයුතු කරන්නේ. විශේෂයෙන් ම අනුන්ගේ වැරදි ගැන සෙවීමට මිනිසාට ඇත්තේ නොතිත් ආශාවක්. ඒ ආශාව නිසා ම බොහෝ දෙනා විවිධ අර්බුදවල පැටළෙනවා. තමන් තුළ අපමණ වැරදි

> ඇතැමෙක් බොහෝ ආශාවෙන් කරන දෙයක් තමයි අනුන්ගේ වැරදි, අඩුපාඩු සෙවීම. මෙයට කියන්නේ ඕපාදූප සෙවීම කියලයි. ලංකාවේ නම් බොහෝ දෙනා පඩි නැති ව කරන එකම රස්සාව තමයි ඒ.

තබාගෙන අනුන්ගේ වැරදි සොයන්නට යාම නුවණැති ක්‍රියාවක් නොවෙයි. ඒ තුළ සිදු වන්නේ අනුන්ගේ දෝෂදර්ශනයට ලක්වීමයි. එය ද ගැටුම් ඇති වන්නට හේතුවක්.

ඇතැමෙක් බොහෝ ආශාවෙන් කරන දෙයක් තමයි අනුන්ගේ වැරදි, අඩුපාඩු සෙවීම. මෙයට කියන්නේ ඕපාදූප සෙවීම කියලයි. ලංකාවේ නම් බොහෝ දෙනා පඩි නැති ව කරන එකම රස්සාව මෙයයි. අනුනගේ ඕපාදූප සොයමින් වෙනත් අයට කියමින් රණ්ඩු සරුවල් ඇති කොට ඒවායෙන් තෘප්තියක් ලබන අවාසනාවන්ත පිරිසක් සමාජයේ සිටිනවා. ඒ අය සිදු කරන්නේ මුළු සමාජය ම විනාශය කරා ගෙන යාමයි. මිනිසාගේ ආධ්‍යාත්මික හා භෞතික වර්ධනය සමබරව පවත්වා ගෙන යාම බෙහෙවින් අපේක්ෂා කළ අපේ බුදුපියාණන් වහන්සේ නිරන්තරයෙන් ම ගැටුම් නැති සමාකාමී පරිසරයක් අපේක්ෂා කළා. ඒ නිසා ඕපාදූප සොයන්නට ඇති ආශාව අත් හරින්නට උපදෙස් දුන්නා. බුදුපියාණන් වහන්සේ අපට නිරන්තරයෙන් මතක් කර දුන්නේ තමා ව සොයන්න කියායි. (අත්තානං ගවේසෙය්යාථ) තමන් සෙවීමෙන් තමන්ගේ තරම තමාට ම වටහාගත හැකියි.

චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කර ගත් බුදුපියාණන් වහන්සේ ඒ ආර්ය සත්‍යය ධර්මයන් ගැන නිසැක භාවයෙන් කටයුතු කළා. එසේ කළේ ඒ ආර්ය සත්‍යයන් ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කර ගත් බැවිනුයි. ඒ නිසා ම උන් වහන්සේට එම සත්‍යයන් පිළිබඳ ව කිසිදු සැකයක් ඇති වූයේ නැහැ. ප්‍රත්‍යක්ෂය තුළ සැක ඇති වන්නේ නැහැ. සැක ඇති වන්නේ අනුමානය තුළයි. බුදුපියාණන් වහන්සේ ශාස්තෘන් වහන්සේ නමක් ලෙසින් අපට මේ ආර්ය සත්‍යය ගැන දේශනා කළා. එසේ ම මා කියනා නිසා ම එය පිළිගත යුතු යැයි කෙදිනක වත් අපට බලපෑම් කළේ නැහැ. උන් වහන්සේ ධර්මය සම්බන්ධයෙන් අපට සිහිපත් කළේ එන්න බලන්න, (ඒහිපස්සිකෝ) මේ ධර්මය තමා තුළට ම ගෙන ක්‍රියාත්මක කරන්න (ඕපනයිකෝ) යනුවෙනුයි. ධර්මය පිළිබඳ ව නිසැකභාවය උපදවා ගත හැක්කේ එසේ ක්‍රියාකිරීමෙන් පමණයි.

සැකය සිත තුළ ඇති වන්නේ නොදැනුවත්කම නිසායි. නොදැනුවත්කමට වගකිව යුත්තේ තමාමයි. දැනුවත්වීම තමාගේ වගකීමකි. අන් අයට කළ හැක්කේ ඒ සඳහා මඟ පෙන්වීමක් පමණි. බුදුපියාණන් වහන්සේ නිවන් මඟ නොදන්නා අයට මඟ පෙන්වීම සිදු කළා. ශ්‍රාවකයාගේ වගකීම වන්නේ එහි ගමන් කිරීමයි. නිවණ පිළිබඳ සැකය නැති කර ගත හැක්කේ ඒ නිවන් මගෙහි ගමන් කිරීමෙන් පමණි. බුදුපියාණන් වහන්සේ අපට මේ ධර්මය ප්‍රත්‍යක්ෂ කර ගන්න යැයි දේශනා කළේ ඒ තුළ අපේ සිතේ සැකය දුරු වන නිසාවෙනි. ශ්‍රේෂ්ඨ නායකයෙක් කිසි දිනෙක තමන්ගේ අනුගාමිකයන්ගේ සිත් තුළ සැක සංකා තබා ගන්නට දෙන්නේ නැහැ. විශේෂයෙන් තමන් ගැන හෝ තමන් පෙන්වන මඟ ගැන සැක සංකා ඇති කර ගන්නට දෙන්නේ නැහැ. ඒ සඳහා නිරන්තරයෙන් ම විවෘත භාවයකින් කටයුතු කරනවා. ඕනෑම තැනක විවෘත විය හැක්කේ තමන්ගේ අවංකකම නිසයි. තමන්ගේ නිවැරදි භාවය නිසයි. සැඟවිය යුතු කිසි දෙයක් බුදුපියාණන් වහන්සේට නොවූ බැවින් උන් වහන්සේ තම අනුගාමිකයන්ට විවෘත ව පැවැසුයේ මේ ධර්මය වෙතට අවුත් විමසා බලා පිළිගැනීම කරන ලෙසයි. ලෝකයෙහි බොහෝ ආගම් හා දර්ශන මතවාද බිහි කළ ආගමික නායකයන් හෝ එම දර්ශන මතවාද ප්‍රශ්න කිරීමට කිසිවෙකුටත් අයිතියක් ලබා දී නැහැ. නමුත් බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේ අවබෝධ කළ ධර්මයෙහි ප්‍රත්‍යක්ෂ ඥාණයකින් කටයුතු කළ නිසාත්, එහි ඇති නිවැරදිභාවය නිසාත් එය කිසිවිටෙකත් අනුන්ගෙන් සඟවාළීමට උත්සාහ කළේ නැහැ. එය උතුම් ශාස්තෘවරයෙකුගේ වැදගත් ලක්ෂණයක්. ආර්ය සත්‍යය ගැන නිසැක භාවයෙන් කටයුතු කළ බුදුපියාණන් වහන්සේ අපට ද ඉගැන්වූයේ සැකය දුරු කර ගන්නා ලෙසයි.

තණ්හාව නම් වූ චෛතසිකය බුදුදහමෙහි බොහෝ ගැඹුරින් විග්‍රහ වෙන දෙයක්. ලෝකය ම දුක මත පිහිටා තිබේ නම් ඒ දුකට හේතුව තණ්හාවයි. ඒ තණ්හාව බුදුපියාණන් වහන්සේ විසින් ක්ෂය කළා.

තණ්හාව ඇලීම සේම ගැටීම ද ඇති කරවන්නට හේතු වන සිතිවිල්ලයි. ලොව සිටින බොහෝ දෙනා කායික වාචසික සේම මානසික ව ද දුරාචාරකම්හි යෙදෙන්නේ මේ තණ්හාව පාලනය කළ නොහැකි නිසයි. සීලය හෙවත් කායික වාචසික සංවරය ඇති කර ගැනීම තුළ වන්නේ තණ්හාව පාලනය කර ගැනීමක්. මිනිසුන් සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමය වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, මත්වතුර බොන්නේ ඒ දේ කරන්නට ඇති ආශාව නිසයි. සිල් සමාදන් වී සිදු කරනුයේ ඒ ආශාව යටපත් කර ගැනීමයි. ඒ අර්ථයෙන් සීලය කියන්නේ තණ්හාව නැති කරන ප්‍රතිපදාවක්.

තණ්හාව ඇති නොවන ලෙසට සිල්වත්වීම තමයි නිවනටත් උපකාරී වන්නේ. යමෙක් තණ්හාව නැති වෙන ලෙසින් සිල්වත් වන්නේ නම් ඒ තැනැත්තා නිවණටත් සමීප වෙනවා සේ ම සමාජයටත් සලසන්නේ මහත් අස්වැසිල්ලක්. තණ්හාවෙන් තොර මිනිසා ලෝක සාමයට දක්වන්නේ මහත් දායකත්වයක්. ලෝක සාමය වෙනුවෙන් කටයුතු කළ බුදුපියාණන් වහන්සේගේ නිරන්තර ඉගැන්වීම වූයේ බාහිර ලෝකයේ සාමය ඇති කිරීමට නම් ආධ්‍යාත්මික ලෝකයේ සාමය ඇති කර ගත යුතු බවයි. ඒ සඳහා තණ්හාව ප්‍රධාන ක්ලේශ ධර්මයන් ප්‍රත්‍යාහණය කළ යුතු බව උන් වහන්සේ ප්‍රත්‍යක්ෂ අවබෝධයෙන් යුතුව අපට පෙන්වා දුන්නා.

සිතිවිලිවලට ඇති බැඳීම හෙවත් හඳුනා ගන්නා අරමුණු සිතෙහි තැන්පත් කරගැනීම පුහුදුන් සත්ත්වයාගේ සාමාන්‍ය සිරිතක්. එසේ සිතෙහි තැන්පත් වෙන, සිත කිළිටි කරන සිතිවිලිවලට කියන්නේ අනුසය ක්ලේශ කියලයි.

ඉතිරි කොටස 09 පිටුවට...

## පෝය ලබන හා ගෙවෙන වේලාවන්

### වෙසක් පුර අටවක පෝය

අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා අපර භාග 2.39න් පුර අටවක ලබා මැයි මස 1 වැනිදා සිකුරාදා අපර භාග 1.27න් ගෙවේ. සිල් සමාදන් විය යුත්තේ බ්‍රහස්පතින්දා ය.

### වෙසක් පුර පසළොස්වක පෝය

මැයි මස 6 වැනි බදාදා අපර භාග 7.44න් වෙසක් පුර පසළොස්වක පෝය ලබා 7 වැනිදා බ්‍රහස්පතින්දා අපර භාග 4.15න් ගෙවේ. සිල් සමාදන් විය යුත්තේ බ්‍රහස්පතින්දා ය.

### වෙසක් අව අටවක පෝය

මැයි මස 14 වැනිදා බ්‍රහස්පතින්දා පූර්ව භාග 6.51න් අව අටවක ලබා 15 වැනිදා සිකුරාදා පූර්ව භාග 8.22න් ගෙවේ. සිල් සමාදන් විය යුත්තේ බ්‍රහස්පතින්දා ය.

### වෙසක් අමාවක පෝය

මැයි මස 21 වැනිදා බ්‍රහස්පතින්දා අපර භාග 9.36න් වෙසක් අමාවක ලබා සිකුරාදා අපර භාග 11.08න් ගෙවේ. සිල් සමාදන් විය යුත්තේ සිකුරාදා ය.

08 පිටුවෙන්...

## ආධ්‍යාත්මික සාමය...

පුහුදුන් සිත තුළ කෙලෙස් නිරන්තරයෙන් ම තැන්පත් වෙලයි තියෙන්නේ. අරමුණු ඉන්ද්‍රියයන්ට ගොදුරු වූ විට ඒ අරමුණු හඳුනා ගැනීම තුළ තමයි අනුසය කෙලෙස් සිත තුළ නැඟී සිට ක්‍රියාත්මක වන්නේ. බුදුපියාණන් වහන්සේ මේ චිත්ත ස්වභාවය මනා ලෙස හඳුනාගෙන අපට ඉගැන්වූයේ හඳුනා ගන්නා අරමුණු නිසා සිතෙහි අලුතින් කෙලෙස් තැන්පත් කර නොගන්නා ලෙස සහ තැන්පත් වී ඇති කෙලෙස් යළි යළිත් අවුස්සා නොගන්නා ලෙසයි. එසේ කරන්නට ගියහොත් වන්නේ සිතිවිලි ආවේග බවට පත් වී තමන්ගේ පාලනයෙන් තොර වී සත්ත්වයා කායික හා මානසික වශයෙන් විවිධ දුරාචාරකම්වලට පෙළඹෙන බවයි. එබැවින් මේ සිතිවිලි පාලනය හෙවත් සිතිවිලි කළමනාකරණය අතිශයින් ම වැදගත් කාරණාවක්.

බුදුපියාණන් වහන්සේ බොහෝ අවස්ථාවල දී අපට උපදෙස් දී තිබෙන්නේ ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියන්ට ගොදුරු වන රූපාදී අරමුණු ගොදුරු වෙද්දී ඒ තුළ කෙලෙස් අවුස්සා නොගන්නා ලෙසයි. සිතෙහි කෙලෙස් තැන්පත් කර නොගන්නා ලෙසයි. දුටු දේ දුටුවා පමණයි. ඒ තුළ කෙලෙස් ඇති කර ගන්නේ නැහැ යන අදහසින් යුතු ව අරමුණු පරිහරණය කරන්නේ නම් සිතෙහි කෙලෙස් තැන්පත් වන්නේ හෝ තැන්පත් ව තිබෙන කෙලෙස් ඇවිළී එන්නේ හෝ නැහැ. එසේ සිතෙහි කෙලෙස් ඇවිළ නොඑන්නේ නම් ආධ්‍යාත්මිකව ඇති වන්නේ මහත් සන්සිඳීමකි. ඒ ආධ්‍යාත්මිකව සංහිඳියාවෙන් යුතු තැනැත්තා ලොවට ඇති කරන්නේ මහත් සැනසිල්ලක්.

බුදුපියාණන් වහන්සේ ලොවට මහත් සැනසිල්ලක් උදාකළ ශාන්ති නායකයාණන් වූයේ ද, ශාන්ති දායකයාණන් වූයේ ද ඒ ආධ්‍යාත්මික සංහිඳියාව නිසයි. ඒ මහා කාරුණිකයාණන් වහන්සේගේ අනුගාමිකයන් වූ අපට උන් වහන්සේට කළ හැකි ඉහළ ම ගෞරවය හා සැලකිල්ල වන්නේ උන් වහන්සේ විසින් පෙන්වා වදාළ මේ ආධ්‍යාත්මික සංහිඳියාව ඇති වන ගුණ ධර්ම අපගේ ජීවිතය තුළ හැඩ ගස්වා ගැනීමයි. එබැවින් මේ වෙසක් සමයෙහි ඔබේ සිත තුළ ද්වේෂයට ඉඩ නොදෙන්න. අනුන්ගේ වැරදි සෙවීමට ඇති ආශාවට ඉඩ නොදෙන්න. සැකයට ඉඩ නොදෙන්න. තණ්හාවට ඉඩ නොදෙන්න. හඳුනා ගන්නා අරමුණු නිසා සිතෙහි කෙලෙස් ඇතිවීමට හෝ තැන්පත්වීමට ඉඩ නොදෙන්න. එය ඉහළ ම බුද්ධ පූජාවක් වනු නොඅනුමානයි.

# පහසු පෝෂණයට දහමින් උපදෙස්



කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ අතුලදස්සන බෞද්ධ මධ්‍යස්ථානාධිපති අමරපුර ශ්‍රී සද්ධම්ම වංශ පාර්ශවයේ අනුනායක
**බොරැල්ලේ අතුල අනු නා හිමි**

**පෘථග්ජන සත්වයෙකුගේ ජීවිතය ලස්සන කළ හැක්කේ හොඳ ගති ගුණ හා සිතිවිලිවලට පමණක් බව යම් දිනක බොහෝ කෙනෙකුට වැටහෙනු ඇත.**

සෑම පුද්ගලයකුට ම ජීවිත තුනක් ඇත. එනම් පොදු ජීවිතය, පෞද්ගලික ජීවිතය හා රහසිගත ජීවිතයයි. තමන් මෙතෙක් ගත කළ ජීවිතය දෙස ආපසු හැරී ආවර්ජනය කොට බලා කෙනෙකුට සතුටු විය හැකි නම්, ඒ ජීවිතය බොහෝ වාසනාවන්ත ය. කැමැති දේ නැති වූවත් ජීවත්වෙන්න පුරුදු වෙන්න. අකමැති දේ සමඟ ජීවත්වීමටත් පුරුදු විය යුතු ය. මෙ ජීවිතයේ සෑම දේම තාවකාලිකයි. ඉවසීම වේදනාත්මකයි. නමුත් එහි අවසන් ප්‍රතිඵලය සුන්දරයි.

තථාගත බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන සමයේ, පන්සීයක් පමණ පෘථග්ජන භික්ෂූන් වහන්සේලා පිරිසකට කමටහන් ලබා දුන් සේක. මේ පන්සීය දෙනා වහන්සේට ම වැඩ සිටින්නට සුදුසු ස්ථානයක් සොයා වැඩම කළහ. එක්තරා තුරුලතාවන්ගෙන් පිරිපුන් සුදුසු රමණීය වනයක් දැක එහි නැවතී, වස් තුන් මාසය එහි ගත කිරීමට තීරණය කළහ. එම වන පෙදෙසහි ආශ්‍රය කරමින් වාසය කළ දේවතාවුන් වහන්සේලාට මෙ භූමියට වැඩම කළ භික්ෂූන්ගේ සීලාදී ගුණානුභාවය නිසා වැඩ විසීම දුෂ්කර විය.

වනයට වැඩම කළ භික්ෂූන් මේ රමණීය වන පෙදෙස තුළ භාවනානුයෝගීව ගත කරන හෙයින් වනයට, වෘක්ෂයන්ට අධිගෘහිත භූමාටු දෙවියන් විසින් භික්ෂූන් වහන්සේලා නෙරපීම සඳහා දක්වන ලද බියකරු අරමුණු හා ශබ්දවලින් පෘථග්ජන භික්ෂූන් බිය වූහ. බවුන් වඩන භික්ෂූන්ගේ ගත ද සිත ද දෙවියන්ගේ මේ ක්‍රියා තුළින් දුර්වල විය. මෙම භික්ෂූන් දින කීපයකින් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ සියලු තොරතුරු සැලකර සිටියහ. තුන්කල් දක්නා නුවණින් යුතු බුදුරජාණන් වහන්සේ විසින් මහණෙනි, ඔබලාට භාවනා කිරීමට සුදුසු ස්ථානයක ඔය රමණීය වනයම වේ යැයි පැවසූහ. නැවත ඒ වනයට ම වැඩම කරන්න යැයි පවසා, මෙම පිරිත් සූත්‍ර දේශනා කොට ආරක්ෂක පිරිතක් ලෙස භාවිත කරන්න යැයි කරණීය මෙත්ත සූත්‍රය දෙසූහ.

ඒ භික්ෂූහු ද මෙය හදාරා පුරුදු පුහුණු කිරීමෙන් ඒ වනයෙහි ම බවුන් වැඩූහ. එවිට එම වනයට අධිගෘහිත දේවතාවෝ ද මෙම භික්ෂූන්ට බෙහෙවින් උපකාර කළහ. මෙම කරණීය මෙත්ත සූත්‍රය තුළින් වැදගත් කරුණු දෙකක් ඉදිරිපත් වේ. ඒ මෛත්‍රීය වඩන්නකු තුළ තිබිය යුතු අංග ලක්ෂණ හා මෛත්‍රීය වැඩිය යුතු ආකාරය යන්නයි.

> සෑම පුද්ගලයකුට ම ජීවිත තුනක් ඇත. එනම් පොදු ජීවිතය, පෞද්ගලික ජීවිතය හා රහසිගත ජීවිතයයි. තමන් මෙතෙක් ගත කළ ජීවිතය දෙස ආපසු හැරී ආවර්ජනය කොට බලා කෙනෙකුට සතුටු විය හැකි නම්, ඒ ජීවිතය බොහෝ වාසනාවන්ත ය. කැමැති දේ නැති වූවත් ජීවත්වෙන්න පුරුදු වෙන්න.

කරණීය මෙත්ත සූත්‍රයෙන් මෙත් වැඩිය යුතු පුද්ගලයකුට තිබිය යුතු ගුණාංග දහහතරක් දේශනා කළහ. මෙම ගුණාංග දහහතරෙන් එක ගුණයක් ලෙස "සුභරෝච" ගුණය හැඳින්විය හැකියි. "සුභරෝච" යන්නෙහි අදහස පහසුවෙන් පෝෂණය කළ හැකිය යන්නයි.

තථාගත බුදුරජාණන් වහන්සේ භික්ෂු ජීවිතය වර්ණනා කරන තැන බුදුරජාණන් වහන්සේ පියාපත් බර පමණක් සහිතව අහසෙහි පියාසර කරන පක්ෂියෙක් මෙන්ය යන අදහසයි.

ගිහි පින්වතෙකුට වුව ද මේ ලක්ෂණය රඳවා ගැනීම දුෂ්කර නොවන්නේය. මමත්, පවුලේ උදවියත්, ගමත්, පළාතත්, රටත් සැහැල්ලුවෙන් ජීවත්විය හැකි, පහසුවෙන් පෝෂණය කළ හැකි චරිතයක් ලෙස ගොඩනගා ගැනීම වටින්නේ ය. එලෙස ම පරලොවටත්, භව ගමනටත් විශාල ශක්තියක් හා වාසනා ගුණයක් ඇති චරිතයක් බවට ගොඩනගා ගැනීම සේ ම බාහිර ආධ්‍යාත්මික, ලෞකික, ලෝකෝත්තර සාධනයට " සුභරෝච" ගුණය ඉතා වටිනා ගුණයකි.

ධර්මය අසන්න, සිල් රකින්න, දන් දෙන්න, භාවනා කරන්න, පුණ්‍ය කටයුතුවල නියැළෙන්න එනම් ධර්මයේ හැසිරෙන්නට කාලයක් නැතැයි කියූ සමහර පුද්ගලයන්ට වර්තමානයේ හොඳම තෑග්ග කොරෝනා උවදුරයි. රැවටීමට වඩා ප්‍රතික්ෂේප කිරීම වටී. ලබා ගැනීමට වඩා බලා ගැනීම වටී. ආදරයට වඩා පරිත්‍යාගය වටී. උගත්කමට වඩා මනුස්සකම වටී.

වර්තමාන සමාජයේ සමහර පුද්ගලයන් කොපමණ තිබුණත්, කොපමණ ලැබුණත් කිසිම ආකාරයක තෘප්තියක් ලබන්නේ නැහැ. මෙවන් අතෘප්තිකර සමාජයකට තමන්ව පහසුවෙන් පෝෂණය කරන්නට පුළුවන් ජීවිතයක් ගත කරන්න හැකි නම් එතැන අර නිවුණු ගතිය, නැති නම් සැහැල්ලු ගතිය පිළිබිඹු වේ.

වර්තමාන සමාජයේ සමහර පුද්ගලයෙක් තමන් ලද හා ලබාගත් භෞතික වස්තූන්ට එහා ගිය වස්තුවක් ලබන්නට උත්සාහවත් වේ. එනම් තමන් ලබන වැටුපේ පමණ දැන වියදම් නොකොළොත් ඔහුගේ හෝ ඇයගේ සැහැල්ලු ජීවිතය එනම්, පහසුවෙන් පෝෂණය කළ හැකි ජීවිතය ලෝකයට බරක්. බරක් නැතිව සමාජයක ජීවත් වෙන්නට පුළුවන්නම්, ඒ ජීවිතය " සුභරෝච" යන ගුණයෙන් බැබළෙන ජීවිතයක් වෙවි.

දීපා පෙරේරා

# Mettha : A Tool To Resolve Mental Agony



Ven. Dr. Mirisse DhammikaThera

**Mettha, loveand kindness are words that have similar meanings. Buddhism teaches Mettha while Christianity teaches love and Islam teaches brotherhood. The meaning of mettha is explained extensively in KuddhakhaNikaya of the Sutra Pitaka. The experience of love, affection or friendliness commonly known to us covers a wide range of emotions.**

This experience is also described by words such as friendliness, kindness, love or affection. Easily, it is extended towards our immediate family, relatives and friends but, fades away when extended beyond them. Therefore, the commonly known love, kindness or friendliness is limited in experience.Limitations in experience contribute only to limited knowledge which in turn limits our level of perception of friendliness. Limited friendliness based on lustful desires and selfishness does not bring lasting peace and tranquility into our minds. As these qualities become ardent, unsatisfactoriness overwhelms the mindpromoting greed, ill-will and ignorance.

In the struggle for material prosperity, often, we neglect importantmoral values and get tangled by greed, hatred, ill-will and all other mental agonies. The tangle does noy allow us to realize the true nature of their manifestation. When moral and spiritual value are subdued due to these human weaknesses, it is not uncommon to experience undesirable social change as evidenced by increasednumber of mentally ill people, increased social problems such as drug and alcohol abuse, increased number in crimes and so on. A mind that is in chaos and without direction is bored. In order to shatter the boredom, the untamed mind gets involved deeper in unwholesome thoughts leading to unwholesome actions. Thus, these weaknesses lead humans further on the spiral of unwholesome state which cannot be deterred only with physical and legal means. This is felt as helplessness and hopelessness and seems to be a reason for deterioration of social values including peace and happiness. As explained by the Buddha, these primary weaknesses are ingrained more in the matrix of mind than in the physicalbody.

Therefore, in the quest for a lasting solution, we have to address the root cause of the problem that overwhelms our minds leading to mental agony.

Mettha, a virtue as defined by the Buddha, can resolve the ills that agonizes the mind perpetually. In comparison to this common experience of friendliness, kindness, love or affection, mettha is a divine quality that lies dormant in each one of us. Mettha means friendliness and signifies the state of a friend. It means fraternal affection, unbounded love or friendly emotion, free from lustful attachment. It has the characteristics of beneficence, or the promotion of good will. Functioning for the good of others is the essence of its property. Its manifestation or effect is the filling of the heart with love and

> **"For successful bhavana, an individual needs to recognize the true characteristics of own mind. Since there are six character groups defined for Buddhist bhavana, this recognition will enable one to identify oneself with any one of the following personalities: raga charitha, doshacharitha, mohacharitha, buddhicharitha, vithakkhacharitha and saddhacharitha."**

removal of hatred. Thus, it is a virtue that goes beyond commonly known meanings of love, affection or attachment. Occasionally, this sublime quality is experienced by the average mind when it is based on selflessness. It embraces each and every being indiscriminately- beyond all barriers, and even remotely it does not fade away. Therefore mettha is friendliness or amity which is a limitless sublime virtue.

In the fight against greed, ill-will and ignorance, mettha is not only an essential tool but also an antidote that bring peace and tranquility into the mind which is perpetual disarray. This quality, which is usually dormant, can be developed by mental cultivation or bhavana. The mental cultivation of mettha will lead to the control of impulsiveness in the subconscious mind.

Particularly, introduction of this quality into younger minds has the potential to trigger positive changes in their character formation. In others, it would trigger positive changes by minimizing the unwholesome thoughts and habits. At any level, mettha can bring only positive results. Anyone who is exposed to mind cultivation would develop into a personality with high esteem based on moral values irrespective of religious background. If this can be developed into a daily practice, formation of socially acceptable high moral values along with personality development will result in new and pleasant habits that bring peace and happiness not only to the individual but also to society at large.

Thus, metthabhavanacan be used as a progressive tool in the cognitive and spiritual development of the members in our society.

In order to achieve positive social changes, firstly, our thoughts need to be wholesome. In brief, we need to cultivate non-attachment, friendliness and good-will. As thoughts leads to words and actions, our mind requires a certain discipline related to thoughts in our effort to maximize wholesome thoughts. From practice we know that this can be achieved by metthabhavana. Even though it seems that different cultures have different approaches in dealing with these issues, Buddhist bhavanais universal and equally applicable to any human being who is determined and would like to explore reality on a "do-it" your-self" basis. This is a method that cannot be performed by one on behalf of someone else. It is a direct experience resulting essentially in self-realization.

For successful bhavana, an individual needs to recognize the true characteristics of own mind. Since there are six character groups defined for Buddhist bhavana, this recognition will enable one to identify oneself with any one of the following personalities: raga charitha, doshacharitha, mohacharitha, buddhicharitha, vithakkhacharitha and saddhacharitha.

When one has identified the group correctly, it is easy for one to pick the most suitable method for bhavana. However, irrespective of the nature of the character, mettha leads to cessation of greed, ill-will, or the pugnacious tendency of the chaotic mind. The bhavana which is based on the concept of mettha can remove all defiling thoughts from the mind and restore its pristine purity. Eradication of impulsiveness within the mind through Bhavana results in a pure and a powerful mind. Thus, Buddhist bhavana, is indispensable as a tool in the process of purification of mind from anger and malice. Mettha contributes to the development of a pleasant mental attitude within man in relation to his society as well as to his fellow beings in the external word.

Identification of mettha in its true and correct context and inducing it into the mind that has recognized the true nature of own self is not an easy task. Even though it appears to be beyond human comprehension, this is realistic and is achievable. Application of mettha in the mind is not as simple as it may seem. Therefore, I wish to research by analyzing and examining the human mind which is in continuous agony due to defilements and to introduce the divine virtue of mettha as an important tool in relieving mental agony and unsatisfactoriness of life along the path discussed in various discourses in the Abhidhamma and Sutra Pitaka.



# වෛද්‍ය උපදෙස් පිළිපැදීම බුදුහිමියන් වදාළ පිළිවෙතයි



කොළඹ විශ්වවිද්‍යාලයේ
බෞද්ධ අධ්‍යයන අංශයේ
අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
රාජකීය පණ්ඩිත, ආචාර්ය
**උඩුහාවර ආනන්ද හිමි**

**අතිශය දරුණු වසංගත රෝගයකින් මුළු ලොවම වසාගනිමින් තිබෙන අතර ලෝකවාසී සැමගේම දෛනික ජීවිතය අර්බුදයට ලක්ව තිබේ. මෙම සාතිශය දුක්ඛදායක මෙහොතෙහි රෝග බිය හේතුවෙන් බොහෝ දෙනා මහත් සන්තාපයට පත්ව තිබෙන අතර එයින් ඇතිකරන බිය හේතුවෙන් වික්ෂිප්තව විචාර බුද්ධියෙන් තොරව කටයුතු කරනු දක්නට ලැබේ.**

මෙම පසුබිම යටතේ බුදුරදුන් හා ශ්‍රාවක සංඝ රත්නය කායික සුවතාවය උදෙසා අනුග මන කළ පිළිවෙත් වර්තමානයේ අවිචාරවත් ලෙස හැසිරෙන බොහෝ දෙනෙකුට වැදගත් වේ. බුදුරජාණන් වහන්සේ මෙන්ම ශ්‍රාවක සංඝයාද මනස දියුණු කළ එමෙන්ම සියලු කෙලෙස් ප්‍රහීණ කළ උත්තමයන් වුවද කායික රෝගවලට අවශ්‍ය වෛද්‍ය උපදෙස් පිළිපැද එයට අදාළ විවිධ ඖෂධ මෙන්ම ප්‍රත්‍ය ආහාරපාන භාවිතා කිරීමෙන් සුවපත් වූහ.

උන්වහන්සේලා කිසිවිටෙකත් අවිචාරවත්ව කටයුතු නොකළහ. පිටක ග්‍රන්ථවල සඳහන්වන ජීවක වෛද්‍යවරයා බුදුරජාණන් වහන්සේට මෙන්ම ශ්‍රාවකයන් වහන්සේලාට අවශ්‍ය වෛද්‍ය උපදෙස් නොමඳව ලබාදුන් අතර ඒ සියල්ල පිළිපැදීමට බුදුරදුන් මෙන්ම ශ්‍රාවක පිරිස ද සූදානමින් සිටියහ. දිනක් බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේගේ ශරීරයෙහි තුන්දොස් කිපීම හේතුවෙන් ආනන්ද තෙරුන් අමතා විරේක බෙහෙතක් වැළඳීමට කැමැත්ත පළ කරන ලදී. ආනන්ද තෙරණුවෝ ජීවක වෛද්‍යවරයා වෙත ගොස් බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙහි තුන්දොස් කිපී ඇති හෙයින් විරේක බෙහෙතක් වළඳනු කැමතියැයි දැන්වූහ.

ජීවක වෛද්‍යවරයා ආනන්ද තෙරුන් අමතා වෛද්‍ය උපදෙස් ලබාදෙමින් තථාගතයන් වහන්සේගේ ශරීරයෙහි තෙල් ගල්වා සම්බාහනය කොට මාංශ පේශී ලිහිල් කරන මෙන් දැන්වූහ. ආනන්ද තෙරණුවෝ වෛද්‍ය උපදෙස් පරිදි දින කිහිපයක් තථාගතයන්වහන්සේගේ ශරීරයේ තෙල් ගල්වා මාංශපේශී මොළොක්කොට ජීවක වෛද්‍යවරයාට ඒ බව දැන්වූහ. ඉන් අනතුරුව ජීවක වෛද්‍යවරයා විසින් බෙහෙත් ගල්වන ලද උපුල් මල් මිටි තුනක් බුදුරදුන්ට සිඹීමට සලස්වා උන් වහන්සේට තිස්වරක් මෘදු විරේචනයක් ඇතිකොට තුන් දොස් සමනය කිරීමෙන් අනතුරුව බුද්ධ ශරීරය ප්‍රකෘති තත්ත්වයට පැමිණෙන තෙක් මෘදු ආහාර පමණක් වළඳන මෙන් උපදෙස් ලබාදී තිබේ (යාව භන්තෙ භගවතො කායො පකතත්තො හොති අලං තාව යූසපිණ්ඩපාතෙන).

මෙම පුවත ඇතුළත් වන්නේ විනය මහවග්ගපාළි චීවරක්ඛන්ධකයේ ය.

සර්වඥතා ඤාණයෙන් හෙබි බුදුරජාණන් වහන්සේද, තමන් වහන්සේගේ බුද්ධ ශරීරයේ ඇතිවුණ තුන් දොස් සමනය කරගැනීම සඳහා ජීවක වෛද්‍යවරයාගේ උපදෙස් පිළිපැදි බව මෙයින් තහවුරු වේ.

එක් දිනක් දේවදත්ත තෙරුන් අජාසත් රජු හා එක්ව කුමන්ත්‍රණය කොට බුදුරදුන් ඝාතනය කිරීමේ අරමුණින් ගිජ්ඣකූට පර්වතයට නැග එහි පාමුල වැඩ සිටි තථාගතයන් වහන්සේගේ හිස මතට ගලක් පෙරලී ය. එය වෙනත් ගලක ගැටීමෙන් කැඩී ගිය ගල්පතුරක් බුදුරදුන්ගේ ශ්‍රී පාදයෙහි වැදී තුවාල විය. භික්ෂූන් වහන්සේලා තථාගතයන් වහන්සේගේ ඉල්ලීම පරිදි නුදුරෙහි පිහිටි ජීවක වෛද්‍යවරයා විසින් බුදුරදුන්ට පූජා කළ අඹ උයනට බුදුරදුන් රැගෙන ගියහ. එහි පැමිණි ජීවක වෛද්‍යවරයා තථාගතයන් වහන්සේගේ පාදයේ වූ තුවාලයට නිසි පිළියම් යොදා සුවපත් කෙළේ ය. මෙම පුවත ඇතුළත් වන්නේ ධම්මපදට්ඨකථාවේ ජීවක කථා වස්තුවේ ය.

බුදුරජාණන් වහන්සේ කෙරෙහි පමණක් නොව භික්ෂූන් වහන්සේලාගේ ද සෞඛ්‍යාරක්ෂාව සඳහා ජීවක වෛද්‍යවරයා විසින් විවිධ අවස්ථාවල උපදෙස් ලබා දුන් අතර උන්වහන්සේලාගේ කායික නිරෝගීභාවය වෙනුවෙන් බුදුරදුන් වෙතින් ශික්ෂා පද පැනවීමෙහිලා කටයුතු කළ අවස්ථා විනය පිටකයේ අන්තර්ගත වේ. විශාලා මහනුවර වැසි භික්ෂූන් වහන්සේලා ප්‍රණීත ආහාර වැළඳීමෙන් ස්ථූල ශරීර ඇත්තන් බවට පත්ව බොහෝ ලෙඩ රෝග වලින් පෙළෙමින් වාසය කළහ.

කිසියම් අවශ්‍යතාවක් වෙනුවෙන් විශාලා මහනුවරට ගිය ජීවක වෛද්‍යවරයා මෙසේ ස්ථූල ශරීර හා බොහෝ ආබාධ සහිතව වෙසෙන භික්ෂූන් වහන්සේලා දුටුවේ ය. අනතුරුව බුදුරදුන් හමුවට ගොස් භික්ෂූන් වහන්සේලා පෙරමෙන් නොව ප්‍රණීත භෝජන වළඳ ස්ථූල ශරීර හා බොහෝ අබාධ සහිතව වෙසෙන හෙයින් සක්මන හා ජන්තාඝරය අනුදැන වදාරණ මෙන් ඉල්ලා සිටියේ ය. ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම කෙරෙහි කාරුණික වූ බුදුරජාණන් වහන්සේ භික්ෂූන්-වහන්සේලාගේ ශරීර සුවතාව වෙනුවෙන් සක්මන් මළුවද ජන්තාඝරයද අනුදැන වදාළහ. ඉන් අනතුරුව වරින් වර එම ශික්ෂා පදයට අයත් කරුණු නැවත නැවතත් සංශෝධනය කරමින් විධිමත් අයුරින් සකමන් මළුවක් හා ජන්තාඝරයක් සකස් කර ගන්නා ආකාරය පැහැදිලි කොට වදාළහ. මෙම පැනවීමෙන් අනතුරුව සැම ආරාමයකම සක්මන් මළුවක් හා ජන්තාඝරයක් ආරාම ගොඩනැගිලි අතරට එක් විය. ජන්තාඝරය බෞද්ධ ආරාමවල ප්‍රධාන අංගයක් බවට පත්වූ අතර ඒ සම්බන්ධයෙන් අනුගමනය කළයුතු විධි නියමයන් ඇතුළත් ජන්තාඝර වතක්ද හඳුන්වා දෙන ලදි. ජන්තාඝරයකින් සිදු කෙරෙන කාර්ය ආයුර්වේද ප්‍රතිකාර හා සම්බන්ධය. උණු පැන් හා උණු ජල වාෂ්ප මගින් කායික රෝග නිවාරණය කිරීම මෙමගින් සිදු වේ. වෛද්‍යවරයෙකු වශයෙන් ජීවක වෛද්‍යවරයා කළ මෙම උත්තම කාර්යය එකලට මෙන්ම මෙකලටත් වැදගත් වේ.

ඔහු බුදු සසුනට ලැදි වෛද්‍යවරයෙකු වශයෙන් කළ මෙහෙවර ඉතා අගනේය. විනය පිටකයේ දැක්වෙන ඉහත සිදුවීම් දෙක මගින් බුදුන් වහන්සේ මෙන්ම ශ්‍රාවක සංඝයා වෛද්‍ය උපදෙස් කෙරෙහි දැක්වූ සැලකිල්ල පැහැදිලි වේ. ජීවක වෛද්‍යවරයා උන්වහන්සේලාගේ කායික නීරෝගී බව කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වා තිබේ.

විනය හා අටුවාගත මෙම සිදුවීම්වලින් හෙළිවන කරුණ අපගේ රටට බෙහෙවින් වැදගත් වන්නේ මේ වනවිටත් අප සමාජය දරුණු වසංගත රෝගයකින් පීඩා විඳින නිසයි. නික්ලේශී උතුමන්ද තමන්ගේ කායික සුවය වෙනුවෙන් නිසි කල වෛද්‍ය උපදෙස් පිළි ගෙන කටයුතු කර තිබේ. බුදුරදුන් අනුගමනය කරන බෞද්ධයන් වන අප ද අනුගමනය කළ යුත්තේ එම පිළිවෙතයි. ඉතා කඩිනමින් පැතිර යන වංසගත රෝගයෙන් බේරීමට අවශ්‍ය උපදෙස් වෛද්‍යවරුන් විසින් නොමඳව සපයා තිබේ. නුවණැති පුද්ගලයා විසින් කළ යුතු නිවැරදි දේ නම් එම උපදෙස් නොවළහා පිළිපැදීම ය. එහෙත් අප අතර බොහෝ දෙනෙකු ඒ ගැන දක්වන්නේ ඉතා අඩු සැලකිල්ලකි. වෛද්‍ය උපදෙස් නොපිළිපැද විද්‍යාත්මක වශයෙන් වැදගත් නොවන දෑ අනුගමනය කිරීමෙන් සිදුවන්නේ තවදුරටත් වසංගත තත්ත්වය ව්‍යාප්තියට පත්ව මහජනතාව දුකට හා කරදරයට පත්වීමයි.

වෛද්‍ය උපදෙස් අනුව මූලිකව අනුගමනය කළයුතු එක් පිළිවෙතක් වන්නේ හැකිතාක් මහජනයා රැස්වන ස්ථාන මඟහැර කටයුතු කිරීමයි. තනිව වාසය කරන මෙම අවදිය දහමට සිත යෙදවීමට වඩාත්ම යෝග්‍ය කාලය වේ. තමා කෙරෙහි මෙන්ම දුකට හා වේදනාවට පත් ලෝකය කෙරෙහිද දිනපතා මෙත් සිත පතුරුවමින් භාවනාවේ නිරත වීමට හැකි නම් එය ආධ්‍යාත්මික දියුණුවට හේතු වේ.

එසේම ධර්මයට සවන් දීමටත් කියවීමටත් මෙම කාලය ගත කරන්නට කල්පනා කරන්නේ නම් එයද නුවණැති කාර්යකි. ධර්මය හා ජීවිතයේ යථා ස්වභාවය පිළිබඳ ගැඹුරින් ආවර්ජනය කිරීමත් ධර්මානුකූල මානසික අභ්‍යාසයකි. ගස් සිටුවීම දිවා රැය පින් වැඩෙන පින්කමක් ලෙස වන රෝප සූත්‍රයෙහි දැක්වේ. යම් කෙනෙකුට තම ගෙවත්තෙහි එවැනි ඵලදායි ක්‍රියාවක නිරත විය හැකිය.

මේ අනුව ලෝකය පුරා ව්‍යාප්ත වෙමින් මිනිස් ජීවිතවලට හානි කරන වසංගත රෝග යෙන් තමා මෙන්ම අන් අයත් බේරාගැනීමට උනන්දුවෙමින් බුදුරදුන් අනුගමනය කළ පිළිවෙත අනුව වෛද්‍ය උපදෙස් මැනවින් පිළිපදිමින් දහමට ලැදිව සංයමයකින් යුක්තව වාසය කිරීම අප සැමගේ යුතුකම හා වගකීම බව තේරුම් ගත යුතුව තිබේ.

> ජීවක වෛද්‍යවරයා බුදුරජාණන් වහන්සේට මෙන්ම ශ්‍රාවකයන් වහන්සේලාට අවශ්‍ය වෛද්‍ය උපදෙස් නොමඳව ලබාදුන් අතර ඒ සියල්ල පිළිපැදීමට බුදුරදුන් මෙන්ම ශ්‍රාවක පිරිස ද සූදානමින් සිටියහ.



# ධර්මය තුළින් ජීවිතය දකිමු



මහමෙව්නා භාවනා අසපුවාසී
**අළුදෙණියේ සුබෝධ හිමි**

**අද ලෝකයම භීතියට පත් කර ඇති කොරෝනා රෝගය අපි මීට පෙර අත්දුටු රෝගයක් නොවෙයි. එය වසංගත රෝග යක්. භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි කාලයේත් මෙවැනි වසංගත රෝග පැතුරුණු බව අපි දන්නවා. මෙවැනි රෝග නිසා ගම් නියම් ගම් පිටින් ඒ ඒ ප්‍රදේශවල මිනිස්සු බොහෝ පිරිසක් මරණයට පත්වුණා.**

මීට වසර සියයකට පමණ කලින් 1918 සිට 1920 අතර කාලයදී ස්පාඤ්ඤ උණ නමින් වසංගතයක් යුරෝපය පුරා පැතිර ගොස් තිබෙනවා. එයින් මිලියන ගණනක් මියගොස් තිබෙනවා. මේ වයිරසයේ ස්වභාවයත් ඒ වගේම යි. කෙනෙකුගෙන් තව කෙනෙකුට බෝ වෙනවා. ඒ නිසයි රෝගය ලෝකය පුරාම වේගයෙන් පැතිරයමින් තිබෙන්නේ.

බෞද්ධයන් විදිහට අපි කොහොමද මේ රෝගයට මුහුණ දෙන්නේ යන්න අප සිතා බැලිය යුතු වෙනවා.

එහිදී මුලින්ම අප රෝගයේ ස්වභාවය තේරුම් ගත යුතුයි. බෞද්ධයා තර්කානුකූලව සිතමින් බුද්ධිමත්ව යමක් තේරුම් ගන්න කෙනෙක්. එමනිසා අපි සෞඛ්‍ය අංශ විසින් ලබා දෙන උපදෙස් පිළිපැදීම අනිවාර්යයෙන් ම කළයුතු දෙයක්.

මේ සඳහා හොඳ උදාහරණයක් ධර්මයේ සඳහන් වෙනවා.

එක් වස්සාන සමයක භාග්‍යවතුන් වහන්සේ වස් වැසීමට භික්ෂූන් වහන්සේ ට අනුදැන වදාළා. ඉන්පසු මගධ රටේ රජකම් කළ බිම්බිසාර රජතුමා භික්ෂූන් වහන්සේගෙන් ඉල්ලා සිටියා 'අනේ ස්වාමීන් වහන්ස වස් විසීම ටික දිනකට කල්දාන්න පුලුවන්ද?' කියලා.

භික්ෂූන් වහන්සේ ඒ බව භාග්‍යවතුන් වහන්සේට දන්වා සිටියා.

එහිදී භාග්‍යවතුන් වහන්සේ වදාළේ 'පින්වත් මහණෙනි, රජුන්ට අනුගත වෙන්න. රජතුමා කියන දේ කරන්න' කියලයි. අපට පෙනෙනවා අපගේ භාග්‍යවතුන් වහන්සේ කොතරම් මධ්‍යස්ථව මේ සමාජය දෙස බලා තිබෙනවාද කියා.

ඒ අයුරින් අපත් මේ අවස්ථාවේදී සෞඛ්‍ය අංශ විසින් ලබාදෙන උපදෙස් වලට අනුගත වෙන්න ඕනෑ.

අපේ ජීවිත කාලයේ දී මෙවැනි වසංගතයට මුහුණ දුන් පළමු අවස්ථාව මෙයයි. අපි කාටත් මේ සම්බන්ධයෙන් අත්දැකීමක් නැහැ. අපි ඒ සම්බන්ධයෙන් ඉතිහාසයෙන් ඉගෙන ගත යුතුයි. එනිසා අපෙන් තවත් කෙනෙකුට රෝගය බෝ වීම වැළැක්වීම අපගේ වගකීමක්. ඒ සඳහා සමාජ දුරස්ථකරණය හෙවත් පුද්ගලයින් අතර දුරස්ව සිටීම රෝගය ව්‍යාප්ත නොවීමට, වළක්වා ගැනීමට ලොකු රුකුලක් වෙනවා.

ඒ වගේම බෞද්ධ අපි මේ දිනවල පෙරටත් වඩා මෛත්‍රී සහගත කාය කර්ම, වචී කර්ම, මනෝ කර්මවල

> **ජීවිත කාලයේ දී කොරෝනා වැනි භයානක වසංගතයකට අප මුහුණ දුන් පළමු අවස්ථාව මෙයයි. මේ සම්බන්ධයෙන් අප කිසිවෙකුට අත්දැකීමක් නැහැ. එනිසා අපෙන් තවත් කෙනෙකුට රෝගය බෝ වීම වැළැක්වීම අපගේ වගකීමක්. ඒ සඳහා සමාජ දුරස්ථකරණය හෙවත් පුද්ගලයින් අතර දුරස්ව සිටීම රෝගය ව්‍යාප්ත නොවීමට ලොකු රුකුලක් වෙනවා**

යෙදෙන්න ඕනේ. අපි රජය විසින් ලබා දෙන උපදෙස් අනුගමනය කළා කියන්නේ තමාගේත් අන් අයගේත් යහපත පිණිස කටයුතු කළ බවයි.

භාග්‍යවතුන් වහන්සේගේ ධර්මයේ සඳහන් වෙනවා, තමන්ගේත් අන් අයගේත් යහපත උදෙසා කටයුතු කරන්න කියලා. යම් කෙනෙක් එසේ කරනවා නම් ඔහු භාග්‍යවතුන් වහන්සේ ගේ අවවාද පිළිගත් කෙනෙක්. ඒ වගේම ඔහු තමාගේත් අන් අයගේත් දියුණුව කැමැති කෙනෙක්. සතුට කැමැති කෙනෙක්. තමාගේ දුක මෙන්ම අන් අයගේ දුක අකමැති කෙනෙක්.

එහෙමනම් අපි නො දැනීම මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා කියන සිව් බඹ විහරණ වඩන කෙනෙක්.

එනිසා මේ වසංගතය දුරු කිරීමට අපි යම් දෙයක් කයින් කරනවා නම් එය මෛත්‍රී සහගත කාය කර්මයක්.

ඒ රෝගයෙන් වැළකීමට අපගේ වචනය භාවිතා කරනවා නම් එය මෛත්‍රී සහගත වචී කර්මයක්. මේ රෝගයෙන් වැළකීමට රජයේ උපදෙස් පිළිපදිනවා නම් එය අනුගමනය කිරීමට අපගේ මනස මෙහෙයවනවා නම් එය මෛත්‍රී සහගත මනෝ කර්මයයි.

බෞද්ධයන් විදිහට අප කළ යුතු අනෙක් කරුණ තමයි භාග්‍යවතුන් වහන්සේ වදාළ ධර්මය සිහි කිරීම.

උන්වහන්සේ වදාළේ සංසාර ගමන බොහෝ දුක්බරයි කියලා. අප නො සිතපු දේයි වෙන්නේ. සිතන දේ වැනසී යනවා.

මේ ධර්මතාවය ලෝකය පුරා කොතැනත් දකින්නට තිබෙනවා. අපි කවුරුත් හිතුවේ නැහැ ඉතාලිය ප්‍රංශය වගේ රටවල් හිටිහැටියේ මළවුන්ගේ නගර වෙයි කියලා. ඉතාම කුඩා ඇසට නොපෙනෙන වයිරසයක් හමුවේ දණ ගසාවි කියලා.

එහෙමනම් මේ ලෝක ධර්මතාව අපි සිහි කළ යුතු යි. අපි කාටත් අනිත්‍ය ධර්මතාවයෙන් බේරෙන්න බැහැ. රාජ කුමාරවරු, බලවත් රටවල අගමැතිවරු, වෛද්‍යවරුන් පොහොසත් දුප්පත් භේදයකින් තොරව රෝගයට ගොදුරු වුණා. එහෙම නම් රජෙක් වුවත් ඉපදීම ලෙඩවීම, වයසට යාම, මරණයට පත්වීම කියන ධර්මතාවයන්ගෙන් නිදහස් වෙන්න බැහැ. එය ලෝක සත්ත්වයන්ට පොදු ධර්මතාවයක් බව පසක් කරගන්න අපට මෙය හොඳ අවස්ථාවක්. සසරේ ස්වභාවය හොඳින් තේරුම් ගෙන දුක නම් වූ ආර්ය සත්‍යය පසක් කරගෙන ඒ ඔස්සේ සිත මෙහෙයවන්න සිහිය උපදවා ගන්න නිමිත්තක් ලෙස අපි කොරෝනා වයිරසය දකිමු.

**නයනා නිල්මිණී**

## සේරිවාණිජ ජාතකය



**අද කවරයෙන් දැක්වෙන්නේ සේරිවාණිජ ජාතකය යි.**

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි දී පසුබට වීර්ය ඇති භික්ෂුවක් මුල්කරගනිමින් සේරිවාණිජ ජාතකය දේශනා කොට වදාළහ. අප බෝසතාණන් වහන්සේ පෙර එක් භවයක සේරිව රාජ්‍යයෙහි වෙළඳාම් කළහ. එහි ලෝභී වෙළෙන්දෙක් ද විය. දෙදෙනා වෙළඳාම් කළේ ආඩපුර නම් නගරයේ වීදි බෙදා ගෙන ය. ලෝභී වෙළෙන්දා ඇවිදින වීදියෙහි ඉතා දුප්පත් සිටු ගෙයක් විය. මිත්තණියක සමඟ කුඩා දැරියක් එහි ජීවත් විය. ඒ ගෙදර වළං අතර මළ බැඳුණු රන් තලියක් විය. එහෙත් කිසිවෙක් එය රන් බව දැන සිටියේ නැත.

දිනක් ලෝභී වෙළෙන්දා වළලු වෙළඳාමෙහි ගියේ ය. දැරිය ඔහු දැක මටත් පළඳනාවක් ගෙන දෙන්නැයි කියමින් මිත්තණියට ඇවටිලි කළා ය.

'දුප්පත් අප පළඳනා ගන්නේ කෙසේදැයි'' මිත්තනිය කී කළ අපට කිසි 'ප්‍රයෝජනයක් නැති මේ තලිය දී ගනිමු' යැයි දැරිය හැඬුවා ය. අවසානයේ මිත්තණිය වෙළෙන්දාට තලිය දී 'පළඳනාවක් දෙන මැනව්' යි කීවා ය. රන් තලිය අතට ගත් වෙළෙන්දා එහි ඉරක් ඇඳ බැලුවේ ය. එය රන් තලියක් බව දැනගත් වෙළෙන්දාට ලෝභ සිත් ඇති විය. 'මොවුන්ට කිසිවක් නොදීම මා මෙය ගෙන යනවා' යැයි සිතා ''මංචාඩි බාගයක් වත් නොවටිනා මේ තලිය මට කුමටද? '' කියා එය බිම දමා ගියේ ය.

ඒ ලෝභී වෙළෙන්දා ඒ වීදියෙන් පිට විය. බෝසතාණන් වහන්සේ ද වෙළඳාම් පිණිස එහි පැමිණියේ කෙනෙක් වෙළඳාම් කර පිට වූ වීදියට යාමේ වරදක් නොවේ යැයි සිතමිනි. වෙළෙන්දා දුටු දැරිය නැවත මිත්තණියට ඇවටිලි කරන්නට විය.

''පළමුව ආ වෙළෙන්දා තලිය බිම දමා ගියේය. ඉතින් අප කුමක් දී පළඳනාවක් ගන්නද?''

''මිත්තණියනි, කලින් ආ වෙළෙන්දා සැර පරුෂ අයෙක් ලෙස දුටුවෙමි. එහෙත් මේ වෙළෙන්දා නම් ප්‍රිය මනාප බව පෙනේ. අපි මේ තලිය දී පළඳනාවක් ඉල්ලමු ''

මිත්තණිය වෙළෙන්දාට කථා කොට තලිය දී 'මේ හඬන දැරියට කුමක් හෝ දී තලිය ගෙන යන්නැයි' කීවාය. වෙළෙන්දා එය බලා තමන් සතු කහවණු පන්සියයක් හා වටිනා බඩු සියල්ල ඔවුන්ට දුන්නේය. තලියත්, තරාදියත් කහවනු අටකුත් පමණක් ඉල්ලාගෙන යන්නට ගියේ ය. ගඟ ළඟට ගොස් තොටියාට කහවණු අටම දී ගඟෙන් එගොඩ වීමට ඔරුවට නැගුණි.

ලෝභී වෙළෙන්දා නැවතත් අර දුප්පත් නිවෙසට ආවේය. යන්තම් දෙයක් දෙන බව වසා තලිය ඉල්ලුවේ ය. ''ඔබ කිව්වේ ඒ තලිය කිසිදු වටිනාකමක් නොවන බවයි. දැහැමි වෙළෙන්දෙක් එය රැගෙන අපට සියල්ල දී ගියා'' මහලු කාන්තාව පැවසුවාය.

ඒ ඇසූ වෙළෙන්දා මහත් වූ ශෝකයේ තමන්ගේ බඩු භාණ්ඩ ද එහි දමා දිව ගියේ ය. ගඟෙන් එතෙර වන බෝසතාණන් දුටු ඔහු ඉවසාගත නොහැකි ශෝකයෙන් මිය ගියේය

බෝසතාණන් වහන්සේ කෙරෙහි දෙව්දතුන්ගේ පළමු වෛරය බැඳීම එය විය. එකල ලෝභී වූ අඥාන වෙළෙන්දා නම් දේවදත්තය. දැහැමි වෙළෙන්දා නම් සර්වඥයන් වහන්සේ ම ය.

# තමන්ට තමන් පහනක් වන්න



**බුදුරජාණන් වහන්සේගේ දේශනාවට අනුව පැහැදිලි වන්නේ අනුන් ගැන සොයනවාට වඩා තමන් ගැන සෙවීම වැදගත් බවයි. භද්දවග්ගිය කුමාරවරුන් තිස්දෙනාට බුදුරජාණන් වහන්සේ දේශනා කළේ කාන්තාවක් ගැන සොයනවාට වඩා තමන් ගැන සෙවීම වැදගත් බවයි. ඒ අනුව එම කුමාරවරුන් බුදුරදුන්ගෙන් බණ අසා පැවිදි භූමියට පත්ව රහතන් වහන්සේලා බවට පත් වූ සේක.**



උඩරට අමරපුර මහා නිකායික විනයාදිනී කාරක සංඝ සභික මඩුල්ල ද්විතියික පාසලේ නියෝජ්‍ය විදුහල්පති
**මඩුල්ලේ පඤ්ඤාලෝක හිමි**

“අත්තාහි අත්තනෝ නාථෝ”
තමාගේ ගැලවුම්කාරයා තමාම ය.
-ධම්මපදය-

“අත්ත දීපා විහරථ”
තමන්ට තමන් පහනක් වන්න.

බුද්ධ චරිතයෙන් ද මීට අගනා උපදෙස් ලබා දෙයි. සිදුහත් බෝසතුන් හට පස්වග තවුසන් අත්හැර ගොස් තනිවම ආගමික වතාවත්වල යෙදීමෙන් උතුම් වූ බුද්ධත්වය පවා ලබා ගැනීමට හැකි විය.

අනුන්ගේ පරොස් බස් (පරුෂ වචන) ආදිය මෙනෙහි නොකළ යුතු ය. අනුන් කළ නොකළ දෑ ද සොයා නොබැලිය යුතු ය. තමා විසින් නොකළ වැඩ ගැන සොයා බැලිය යුතු ය. ඒ බුද්ධ දේශනාවයි.

වර්තමානයේ ලොවම වෙළා ගත් වසංගතයක් බවට පත්ව ඇති කොරෝනා වයිරසය හමුවේ ශ්‍රී ලංකාවට ද රෝග භීතියෙන් පීඩා විඳීමට සිදුව ඇත. සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් හුදකලාව ජීවත් වීම මෙම භීතියෙන් වැළකීමට තිබෙන එකම පිළියමයි. සිතන්නට පුරුදු වන්නාට හුදකලාව ස්වර්ගයකි යන වියත් වදනින් ද තහවුරු වන්නේ අනුන් ගැන සොයනවාට වඩා තම ශක්තීන් ප්‍රයෝජනයට ගෙන ක්‍රියා කිරීම වඩාත් උචිත බවයි. අද වන විට විශ්වවිද්‍යාල සිසුන් හා වියතුන් විවිධ අංශයන් හි සමත්කම් දක්වමින් අති නවීන වෛද්‍ය උපකරණ මෙන් ම තවත් බොහෝ නව නිපැයුම් නිර්මාණය කරන්නේ ඔවුනගේ ස්වකීය හැකියාවන් පදනම් කරගනිමිනි.

සමාජයේ වෙසෙන ඇතැම් අයගේ ස්වභාවය තම දියුණුව නොව අන් අයගේ වගතුග සොයා බලමින් ඕපාදූප කතා කරමින් සහ අනුනට ඊර්ෂ්‍යා කරමින් නිස්කාරණයේ කාලය වැය කිරීම ය. අන් අයට වල කපනවා වෙනුවට භේද විරහිතව සමානාත්මතා ගුණයෙන් හා ධනාත්මක චින්තනයෙන් එකාවන් ව නැඟී සිටීම කළ යුතුම ය. මේ පුංචි ශ්‍රී ලංකා ධරණී තලය ද මේ වන විට දේශපාලන පක්ෂ වශයෙන් කැඩී ඇත.

එහෙත් කොරෝනා නැමැති මාරයා හමුවේ හැමදෙනාම පුද්ගල තරාතිරමක් නොමැතිව එක සමානත්වයට පත් ව ඇත. ලෝකයේ බලවත් රාජ්‍ය මෙන් ම බලයෙන් අඩු රාජ්‍යයන් ද එක සමාන බවට පත්ව ඇත .මේ හැම දෙනාම මුඛ ආවරණ පැළඳීම, නිරතුරුව දෑත් සේදීම සහ සමාජ දුරස්ථභාවය (මීටරයක දුරස්ථභාවය) පවත්වාගෙන යෑමට කටයුතු කළ යුතු ය. මෙම අවදානම් සහගත කොරෝනා රෝගය තුළින් අපට ලබා දෙන පණිවුඩය නම් සෘණාත්මක චින්තනයෙන් බැහැරව ධනාත්මක චින්තනයෙන් පොහොසත් ව කටයුතු කිරීමත් ස්වශක්තියෙන් නැඟී සිටීමත් ආදිය වඩාත් ප්‍රශස්ත බවයි.

මෙම රෝගී තත්ත්වය පැතිරීමට පෙර හැමදෙනාම කාර්යබහුල ජීවිතයක් ගත කිරීම හේතුවෙන් ඇතැම් පවුල්වල දෙමාපිය - දූ දරු සබඳතාවය, ස්වාමි - භාර්යා සබඳතාවය දුරස්ථව පැවතුණි. කොරෝනා රෝගී තත්ත්වය නිසා පවුල්වල සෞඛ්‍ය නිළධාරීන් සහ ආරක්ෂක අංශවල නිළධාරීන් හැර අනෙක් බහුතරයක් පවුල් ඒකක නිවසට වී පවුලේ සාමාජිකයන් සමග සහයෝගයෙන් ගෙදර වත්තේ යමක් වගා කරමින් කටයුතු කිරීමට ඉඩ ලැබීම අගය කළ යුතු පැත්තකි.

මෙම කාල පරාසය තුළ අධ්‍යාපන කටයුතුවල නියැළෙන අය ස්වෝත්සාහයෙන් පොත්පත් කියවා දැනුම වර්ධනය කර ගැනීම, ආගමික වතාවත්වල යෙදෙන අය තම නිදහස සහ විවේකය ඵලදායි ලෙස යොදා ගැනීම, ගොවි මහත්වරුන් තම වගාවන්වල යෙදීම ආදී කාර්යන් නිසා ස්වකීය ශක්තිය දියුණු කරගෙන නැඟී සිටීමට මෙම කාල පරාසය ඉතා වැදගත් ය. ගත වූ කාලය තුළ අප ලබා ගත් අත්දැකීම් පදනම් කරගෙන ඉදිරි කාලය ද අර්ථවත් අයුරින් ගත කිරීමෙන් අපගේ ජීවිතවලට භෞතික වශයෙන් මෙන් ම ආධ්‍යාත්මික වශයෙන් ද නවෝදයක් ළඟා කරගත හැකි ය.

කෙනෙකුගේ භෞතික සංවර්ධනය දියුණු කිරීමේ දී තමාගේ කැපවීම, වගවීම ආදිය ඉතා වැදගත් ගුණ ධර්ම වේ. ගම්වල මෙන්ම නගරවල ද ඇතැම් පිරිස් කඩපිල්වල ළඟිමින් බෝක්කු පාලම් උඩ අනුන්ගේ ඕපාදූප කියවමින් රන් හා වටිනා කාලය අපතේ යවන අයුරු ද අපට දක්නට ලැබේ. එසේ නොවී බුද්ධිමත් ව ක්‍රියා කරමින් පුස්තකාල භාවිතය, ස්වකීය ගෙවතුවල විවිධ භෝග වගා කරමින් තම කෘෂි ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට කටයුතු කළ යුතු ය.

ජාතක කථා සාහිත්‍යයේ එන චුල්ලසෙට්ඨි ජාතකයෙන් ද පැහැදිලි වන ආකාරයට එක් පුද්ගලයෙක් මහ මඟ මැරී සිටි මීයකු දැක එම මී කුණ රැගෙන ගොස් බළලුන් ඇති කරන නිවසකට ලබා දීමෙන් තමන්ට ලැබුණු සුළු මුදලෙන් මල් උයන්වල මල් නෙළීමට පැමිණෙන අයට හකුරු කෑල්ලක් හා වතුර වීදුරුවක් ලබා දී ඊට වඩා වැඩි මුදලක් උපයා ගත්තේ ය. මෙලෙස තම ව්‍යාපාර කටයුතු ටිකෙන් ටික දියුණු කරගත් එම පුද්ගලයා වසර කීපයක් ගෙවී යාමත් සමඟ මහා පරිමාණයේ ව්‍යාපාරිකයෙකු බවට පත් විය.

මෙවැනි උපදේශ ස්වකීය ජීවිතයට බද්ධ කරගෙන බැංකු ණයක් ආදිය ලබාගෙන කුඩා වගාවන් හෝ ව්‍යාපාරයන් ආරම්භ කිරීම තුළින් තම ආර්ථිකය දියුණු කරගත හැකි ය. මෙලෙස සැලැස්මක් සහ මනා කළමනාකරණයක් සහිතව අරපිරිමැස්මෙන් ක්‍රියා කිරීමේ දී, මදයට හා ප්‍රමාදයට හේතු වන මත්වතුර හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම, අලසකම අත්හැරීම, නරක මිතුරන් ඇසුරු නොකිරීම, අවේලාවේ වීථි සංචාරයෙන් වැළකීම, උත්සාහය, අයවැය සමව පවත්වාගෙන යාම, ආරක්ෂා සම්පත්තිය, ඉතිරි කිරීමේ පිළිවෙත් ආදිය තම ප්‍රායෝගික ජීවිතයට හුරු වීම තුළින් තම ජීවිතය භෞතික වශයෙන් උසස් තත්ත්වයකට පත් කර ගත හැකි ය..

පංචශීල ධර්මය ආරක්ෂා කිරීම තුළින් තමාගේ ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගත හැකි ය. එහෙත් කනගාටුවට කාරණය නම් පසුගිය ඇඳිරිනීතිය පැවති කාල සීමාව තුළ නගරයෙන් මත්වතුර බෝතල් ගැනීමට නොහැකි වීම නිසා එයට ඇබ්බැහි වී හොර මත් වතුර ආදිය රහසේ නිෂ්පාදනය කරගෙන පානය කිරීමයි. එවන් අය නොයෙක් පැතිවලින් ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගන්නා ලදි. මෙයින් ද ප්‍රකට වන්නේ මෙවැනි ජාතික ආපදා අවස්ථාවක දී පවා ඇතැමුන්ට ඉවසීම පුරුදු පුහුණු කර ගත නොහැකි බවයි. ඒ තරමටම මතට ඇබ්බැහි වූවන්ගේ මනස විකෘති වී ඇති බවයි. මෙය සමස්ත ජාතියේ පරිහාණියට තුඩු දෙන්නකි.

බුදු දහමට අනුව උගන්වන්නේ හොඳ විනයක් ඇතිව පන්සිල් සුරැකීම නිසා ආධ්‍යාත්මික සංවර්ධනයක් සිදුවන බවයි. තම ජීවිතාවබෝධය තුළින් අභියෝගවලට මුහුණ දීම ආධ්‍යාත්මික දියුණුවක් ලද අයට මෙවැනි ගැටලු ඉතා සරල දේවල් බවයි.

තමන්ගේ දුබලතා හඳුනාගෙන තම තමාගේ ආධ්‍යාත්මික සංවර්ධනයට යොමු වීම තුළින් පුද්ගල සංවර්ධනය මෙන්ම පවුල් ඒකක සංවර්ධනය ද ගමේ නගරයේ සමාජයේ සංවර්ධනය ද පුද්ගල සංවර්ධනය ට බලපාන බව සක්සුදක් සේ පැහැදිලි ය.

> “මහ මඟ මැරී සිටි මීයකු දැක එම මී කුණ රැගෙන ගොස් ධනවතකු වූ අයෙක් ගැන ජාතක කථා සාහිත්‍යයෙන් අපට පෙන්වා දී ඇත. ඒ අනුව සුළු දෙයින් පවා නුවණ මෙහෙයවා කටයුතු කිරීමෙන් අපට දියුණු විය හැකි බව වටහා ගත හැකි ය.”



දඹාන - මාවරගල
ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති,
අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**



# පහසුවෙන් ධනවත් වීමට බෞද්ධ ඉගැන්වීම්

**නූතන ලෝකය ධනය මතම පිහිටා ඇත. ධනය වෙනුවෙන් ම උපතේ සිට විපත දක්වා සටන් වදිති. එයට හේතු වන්නේ මිනිස් ප්‍රතිශතය දිනෙන් දින ඉහළ යාම සහ ලොව පවත්නා සම්පත් සීමිත වීමයි. සීමිත සම්පත් ප්‍රමාණයෙන් වැඩි කොටසක් ලබා ගැනීමට වැඩියෙන් ධනය ඉපයිය යුතු වේ.**

ආර්ථිකය යනු අය සහ වැයයි. එනම් ධනය ඉපයීම සහ ධනය වියදම් කිරීමේ න්‍යායයි. ධනය ඉපයීම බුදුන් වහන්සේගේ ආර්ථික න්‍යාය අනුව ක්‍රම දෙකකට සිදුවෙයි. එනම් අධාර්මිකව ධනය ඉපයීමේ ක්‍රමය සහ ධාර්මිකව ධනය ඉපයීමේ ක්‍රමයයි.

අධාර්මිකව ධනය නො ඉපයිය යුතු බව දක්වමින් වෙළඳාම හෙවත් ව්‍යාපාර කටයුතු කරන පිරිස් විසින් 1. මත්ද්‍රව්‍ය වෙළඳාම 2. විෂ වෙළඳාම, 3. මස් වෙළඳාම, 4.මස් පිණිස සත්ත්ව වෙළඳාම, 5. ආයුධ වෙළඳාම යන වෙළඳාම් පහ නො කළ යුතු බව පෙන්වා දෙනු ලබයි. වෙළඳාම මගින් ධනය ඉපයීමේ දී තුලාකූට (කිරීම), මානකූට (මැනීම) වැනි වංචනික ක්‍රම මගින් ධනය වැඩියෙන් නො ඉපයිය යුතු ය. වසංගත රෝග තත්ත්වය උද්ගතව පවතින මෙ සමයෙහි වෙළඳුන් විසින් මෙම වංචනික ක්‍රියා වැඩිපුර සිදු කරන බව පෙනෙයි. එය ධාර්මික වෙළඳාමක් නොවන අතර උපයන ධනය ද අධාර්මික වූවකි.

අනෙකුත් ධාර්මික රැකියා අතර කෘෂිකර්මාන්තය, දැහැමි රාජ්‍ය සේවය සහ ධාර්මික කර්මාන්ත පවත්වාගෙන යාම ප්‍රමුඛ වෙයි. එහෙත් කෘෂිකර්මාන්තයට නැඹුරුවන පිරිස නූතන ලෝකයේ ඉතා අල්ප ය. ලොව දැඩි ආහාර හිඟයකට ගොදුරු වන්නේ කෘෂිකර්මාන්තයෙහි නියැළෙන පිරිස සීමිතවීම නිසා ය. ධාර්මික ව ධනය ඉපයූ තැනැත්තෝ 1. අත්ථි සුඛ (ධාර්මිකව ඉපයූ ධනයක් මා සතුය යනුවෙන් සතුටුවීම), 2.භොග සුඛ, (ඉපයූ ධනය නිවැරැදිව භුක්ති විඳින්නේ යැයි සතුටුවීම), 3. අනන සුඛ (ණය නොවී ජීවත් වන්නේ යැයි සතුටුවීම), 4.අනවජ්ජ සුඛ (සමාජ දෝෂාරෝපණවලින් තොරව ජීවත් වන්නේ යැයි සතුටුවීම) යන ප්‍රීතීන් හතර අනුභව කරති.

ඇතැම්හු ඉක්මනින් පොහොසත්හු වීමට අධාර්මික වෙති. ධනය ඉපයිය යුතු බව අනුමත කරන බුදුදහම එය කළ යුතු වන්නේ බමරා මල නො තලා රොන් ගන්නාක් මෙන් සමාජය නො පෙළා ය. (භමරස්සෙව ඉරීයතො භොගසන්නිචයං යන්ති). තව ද ධාර්මිකයාගේ ධනය තුඹසක් බඳින්නාක් මෙන් ක්‍රමයෙන් වර්ධනය කර ගත යුතු ය (භොගසන්නිචයං යන්ති වම්මිකො වූපචීයති).

ධාර්මික ව ඉපයූ ධනය කොටස් හතරකට බෙදා වියදම් කිරීමේ ප්‍රබල, විශ්ව සාධාරණ සහ අතිශය සාර්ථක ආර්ථික න්‍යායක් බුදු දහමේ ඇත.

ධනය ආරක්‍ෂා කිරීමට සහ උපයන ධනයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට අල්පේච්ඡතාව හෙවත් ජීවිතයේ සරල බව අනිවාර්යයෙන් ම පැවැති ය යුතු ය. බුදු දහම ධර්ම මාර්ග පෙන්වා දීම පමණක් කරන දර්ශනයක් නොව ක්‍රියාවෙන් ම තහවුරු කරන දහමකි. බුදුන්වහන්සේ මෙන් ම උන්වහන්සේගේ ශ්‍රාවක වූ ආර්ය මහ සංඝයා වහන්සේලා ද ආදර්ශයෙන් ම අදාළ ධර්ම කරුණු තහවුරු කර ඇත.

> ‘ලෝබයා කිසිවකුටත් නො දී තමාම සියල්ල භුක්ති විඳියි, මසුරා කිසිවකුටත් නොදෙයි තමාවත් ධනය භුක්ති නොවිඳියි. අල්පේච්ඡ බව යනු ධනය ඇති අයුරින් සරලව ජිවත්වීමයි. ඉතිරිකිරීම යනු ධනය ඇති නැති සියලු දෙනාම කරන කටයුත්තකි.’

ධනය ඇති හෝ ධනය නැති කිසියම් පුද්ගලයෙකු සරල ජීවිතයක් ගත කරන විට සමාජයෙන් ඇතැම් පුද්ගලයින්ගෙන් විවිධ චෝදනා එල්ල වෙයි. ඒ අතර ලෝභයා, මසුරා, ලෝබකමින් ජීවත්වන්නා, තෘෂ්ණාබරිත පුද්ගලයා, මෙන් ම එදිනෙදා සමාජයේ භාවිත කරන විවිධ වදන්වලින් ගැරහීමටත්, ප්‍රතික්ෂේප කිරීමටත් පුරුදුව සිටිති. ලෝභකම සහ අල්පේච්ඡ බව සහ ඉතිරි කිරීම සැබැවින් ම වෙනස් ය. ලෝබයා කිසිවකුටත් නො දී තමාම සියල්ල භුක්ති විඳියි, මසුරා කිසිවකුටත් නොදෙයි තමාවත් ධනය භුක්ති නොවිඳියි. අල්පේච්ඡ බව යනු ධනය ඇති අයුරින් සරලව ජීවත්වීමයි.

ඉතිරි කිරීම යනු ධනය ඇති නැති සියලු දෙනාම කරන කටයුත්තකි. එහෙත් අල්පේච්ඡ ජීවිතයක් ගත කරන්නා ඉතිරි කරන්නේ මතු කවරෙකුගේ හෝ ප්‍රයෝජනය සඳහා ය. එහෙත් ලෝභයා සහ මසුරා ඉතිරි කරන්නේ ඔහුගේ සුඛවිහරණය සඳහා පමණි.

මේ බව තහවුරු වන අපූරු කථා පුවතක් බෞද්ධ සාහිත්‍යයේ එයි. එක් සිටුදියණියකට වසර ගණනාවක් තිස්සේ පවත්නා හිසරදයක් වෙයි. වෛද්‍යවරුන් බොහෝ ප්‍රමාණයක් ප්‍රතිකාර කළත් එයින් සුවයක් නො ලබයි. දිනක් නව වෛද්‍යවරයෙක් ගෙන්වාගෙන ප්‍රතිකාර කරයි. එහි දී ඔහු සිටු දියණියගෙන් ගිතෙල් ප්‍රමාණයක් රැගෙන හිසෙහි ගල්වන විට එයින් කුඩා ප්‍රමාණයක් බිමට පතිත වෙයි. මෙය දුටු සිටු දියණිය වහා සේවිකාවක් කැඳවා එය භාජනයකට එකතු කරන ලෙසට අණ කරයි. මෙය දකින වෛද්‍යවරයා තමාට අද කිසිදු මුදලක් නොමැතිව නිවසට යාමට සිදු වන්නේ ය. මේ සිටුදියණිය මහත් වූ ලෝභ තැනැත්තියක් යැයි සිතී ය. ප්‍රතිකාරය අවසන් විය. සිටු දියණියට සුවය දැනිණි. ඇය මසුරන් දහසක තිළිණයක් වෛද්‍යවරයාට පිරිනැමී ය.

අවසානයේ වෛද්‍යවරයා සිටු දියණිය කෙරෙහි අපැහැදීමට පත් හේතුවත් පැහැදීමට පත් හේතුවත් පවසන්නට විය. එහි දී තමා ප්‍රතිකාර කිරීමට පෙර සිතුවේ සිටු දියණිය අධික ලෝභ තැනැත්තියක් ලෙස බවත් පසුව එය එසේ නොවන බවත් ප්‍රකාශ කරන්නට විය. එහි දී සිටු දියණිය ප්‍රකාශ කර සිටින්නේ ඒ අපතේ ගිය ගිතෙල් ටික සතෙකුගේ හෝ ප්‍රයෝජනයට වටිනා බව ය. එයින් පෙනෙන්නේ ධනය හිමි සහ ධනය අහිමි සියලු දෙනා විසින් ම ඉතිරි කිරීම සහ අල්පේච්ඡ බව ක්‍රියාවට නැගිය යුතු බවයි.

එය ලෝභකමක් හෝ මසුරුකමක් නොවන බවයි. එමගින් කවරෙකුට හෝ යහපතක් සිදුවෙයි. එබැවින් ඉතිරි කිරීම ජීවිතයට මහත් වූ ප්‍රයෝජන සලසයි. අතීතයේ සිංහල ගොවි ගෙවල්වල ගැමි කාන්තාව කුල්ලට සහල් ගෙන එයින් මිටක් ගෙන මුළුතැන්ගේ මුල්ලක තබා ඇති සහල් මුට්ටියට දැමීමේ පුරුද්දක් ඇති කරගෙන තිබුණි. එයින් අසරණ දුප්පතුන් පැමිණි අවස්ථාවල ඔවුන්ට දීමටත්, බත් ඉවීමට සහල් නොමැති විට දරුවන්ට කැද හදා දීමටත් ප්‍රයෝජනයට ගත්තා ය. එය ඉතිරි කිරීම මිස ලෝභකම හෝ මසුරුකම නො වෙයි. ගෙහිමියා මෙන් ම ගෘහණිය සතුව ද මේ වගකීම ප්‍රබලව ක්‍රියාවට නැගිය යුතු ය.

ධනයෙන් මෙන් ම ආහාරවලින් උපරිම ප්‍රයෝජන ගැනීම ද ඉතිරි කිරීමට ප්‍රබලව බලපෑම් කරයි. දිවුල් කන්නාක් මෙන් ආහාර විනාශයට පත් නො කළ යුතුයි. අවශ්‍ය ප්‍රමාණය පමණක් ගත යුතුයි. දිවුල් ගසේ සියලු ගෙඩි බිම හෙළා ඉඳුණු ටික පමණක් ගැනීමෙන් ළපටි ගෙඩි අපතේ යයි. එ බැවින් අවශ්‍ය ප්‍රමාණය පමණක් ගත යුතුයි. ධනය අවශ්‍ය දෙයට පමණක් වියදම් කළ යුතුයි.

ආහාර ගැනීම කුසේ ප්‍රමාණයට පමණක් ගත යුතුයි. මෙය ජීවිතයට මෙන් ම ආර්ථිකයට මහත් වූ ආදර්ශ සපයන්නකි (අප්පායො සමා-නො උළාරං ජීවිකං කප්පෙති. තස්ස භවන්ති චත්තාරො උදුම්බර කාදිකංචායං කුලපුත්තො භොගෙ භාදති). ගෘහ ජීවිතය ගත කරන තැනැත්තා විසින් ආර්ථික සුරක්ෂිත බව පවත්-වා ගැනීමට කරුණු පහක් යටතේ ක්‍රියාත්මක විය යුතු ය. 1.නට්ඨං ගවෙසෙන්ති (විනාශ වූ සම්පත් වේ නම් එය නැවත නඟා සිටුවිය යුතු ය), 2.ජිණ්ණං පටිසංඛරොති (යම් දිරූ දෙයක් වේ නම් එය තවත් දිරාපත්වන්නට නො දී ප්‍රතිසංස්කරණය කළ යුතු ය), 3.පරිමිත පාන භොජනා (සම්පත්වල සීමාවත් තමන්ගේ අවශ්‍යතාවේ සීමාවත් දැනගෙන ආහාර-පාන මෙන් ම සෙසු සම්පත් පරිභෝග කළ යුතු ය), 4.භොග සුඛ (පමණ දැන ආහාර ගැනීම ශරීරය සහ සිත සැපවත් කරයි. කුස ගින්න වැඩි වූයේ යැයි උගුරට එන තෙක් ආහාර ගැනීමෙන් කුස පිරුණත් එයින් ශරීරයට සහ සිතට සැපයක් නො ගෙනෙන අතර අපහසුතාවක් ම ඇති කරයි. එ බැවින් ආහාර ගැනීමේ නිවැරැදි පිළිවෙත් අනුගමනය කළ යුතු ය. සම්පත් අපතේ නො දැමිය යුතු ය), 5. සීලවන්තං ඉත්ථිං වා පුරිසං වා ආධිපච්චේ ඨපෙති (කයත් වචනයත් විධිමත්ව පාවිච්චි කරන සිල්වත් ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ නිවසෙහි අධිපති බව දැරිය යුතු ය) බුදු දහමේ දැක්වෙන මේ ආර්ථික ඉගැන්වීම් හමුවේ බෞද්ධයකුට තම ජීවිතය සකසා ගැනීම අපහසු නොවනු ඇත.

# අත හැරීම වෙනුවට අල්ලා ගැනීම



ඇල්පිටිය අමුගොඩ
ජයසුමනාරාමාධිකාරී
දක්ෂිණ ලංකාවේ
ප්‍රධාන අධිකරණ සංඝනායක
සාහිත්‍යසූරි
**අමුගොඩ සෝමානන්ද නා හිමි**

**ප්‍රශ්නවලට මුහුණ දීමත් ඒවා නිරවුල් කර ගැනීමත් පුද්ගලයාට පැවරෙන කාර්යයකි. බුදු දහමින් පුද්ගලයාට ඒ සඳහා මාර්ගෝපදේශකත්වය සපයයි. බුදු දහමේ මූලික ඉගැන්වීමක් වූ පටිච්ච සමුප්පාද ධර්මය දේශනා කිරීමේ අරමුණ, සත්වයාගේ සසර පිළිබඳ යථා තත්ත්වය විග්‍රහ හා සමාජගත ගැටලුවල යථා තත්ත්වය විග්‍රහ කිරීම හා එමගින් එම ගැටලු විසඳා ගැනීමට ජනතාව යොමු කිරීමය.**

මෙහි ප්‍රධාන පරමාර්ථය සසර දුක නිවා ගැනීම වුවද සමාජගත ජීවිතයේ ගැටලු ද එමඟින් විසඳා ගැන්මට හැකි වේ. හේතුව ඇති විට ඵලය ද ඇති වෙයි. හේතුව ඇති වීමෙන් ඵලය හට ගනියි. හේතුව නැති විට ඵලය නොපවතී. හේතුව නැති වීමෙන් ඵලයද නැතිවෙයි. මෙය මුළු මහත් විශ්වයටම සනාතන ධර්මතාවයකි. එය උපයෝගී කර ගනිමින් පුද්ගල ප්‍රශ්න ද සමාජ ප්‍රශ්නද නිරවුල් ව දැකගැනීමේ අවස්ථාව සැලසෙයි.

කායික මානසික ශක්ති සංයෝගයේ සංකලනයක් වූ පුද්ගලයාටත්, පුද්ගල ඒකරාශීත්වයෙන් ගොඩ නැගුණු සමාජයටත් ගැටලු ඇති වෙයි. එම ගැටලුවලට පිළියම් සෙවීම පුද්ගලයා සතු කාර්යයකි. එවිට විවිධ පිළිසරණ සොයා යෑමට සිදුවෙයි. ඒ සඳහා බුදු සමය පුද්ගලයාට පිහිට වන බව වියත්හු පවා පිළිගනිති.

ප්‍රශ්නයක් මතු වූ විට එය විග්‍රහකොට නිරාකරණය කර ගැනීමේ ක්‍රමවත් විද්‍යාත්මක චින්තනය පිළිවෙළද බුදු සමය නිර්දේශකොට දක්වයි.විද්‍යාඥයෝ විද්‍යාඥාණය තුළින් විවිධ පර්යේෂණ පවත්වති. බුදුවරු ලොව පහළවී ස්වකීය චින්තන ශක්තිය තුළින් ලොව ඇති සියල්ල පිළිබඳ යථා තත්ත්වාවබෝධය ලබා සියලු ගැටලු නිරාකරණය කර ගන්නා විධික්‍රමය මිනිසුන්ට කියා දෙති. එහි දී ලොව පවතින ගැටලු නමැති සියලු ඵල යම් යම් හේතූන් නිසාම හටගන්නා බව, අවධාරණය කර තිබේ. ඒ ප්‍රශ්නවල අදාළ වප්‍රස්තුත සොයා බලා ඒවා විභජනය කර, නිවැරැදිව දැක ගැනීම බුදුදහම, අගය කරයි. එවිට තත්ත්වාකාරයෙන් ඒවා දැක, ඒවාට පාදක වූ මූල නැතිකර ගැටලු විසඳා ගැනීමට අවස්ථාව සැලසෙයි.

කඳු මුදුනකින් ගලා එන එක් දිය බිඳුවකින් ඇරැඹෙන දිය කඩක් ක්‍රමිකව විකාශනය වීමේ දී සුවිශාල ගංගාවක් වෙයි. එසේම ලොව ජනිත වන සෑම බිළිඳෙක්ම එක් පිවිතුරු නිර්මල සිතක් සහිතව උපත ලබයි. එම බිළිඳා ක්‍රමයෙන් වර්ධනය වනවාත් සමඟ සිත ද වර්ධනය වෙයි. පුද්ගලයා ක්‍රමයෙන් සමාජානුයෝජනය වූ විට සමාජය සමග ඒකාබද්ධ වෙයි.

එමඟින් පුද්ගල සුබවාදී බව හා අසුබවාදී බව ගොඩනැගෙයි. එය ක්‍රියාකාරීත්වයේ ස්වරූපයට අනුව සිදු වන්නකි. දුශ්චරිත පුද්ගලයා අපරිශුද්ධත්වයටත්, සුචරිත පුද්ගලයා පාරිශුද්ධත්වයටත් යොමු කරයි. පිරිසුදු බව හා අපිරිසුදු බව පවතිනුයේ තමා තුළම ය. ගැටලුවලට විසඳුම්, පුද්ගලයා මූලික කරගෙනම ලබා දිය යුතු බව බුදු දහමේ විශ්වාසය යි. පුද්ගල ගැටලු ද, සමාජ ගැටලු ද එකිනෙක වෙලී පවතී. පුද්ගල ගැටලු විසඳීමෙන් සමාජ ගැටලු ද විසඳේ. මෙම සියලු ප්‍රශ්න ගොඩනැගෙනුයේ, මිනිස් මනසේ ය. ඉන් පසු ඒවාට විසඳුම් සොයනුයේ ද මිනිස් මනසින්ම ය. බුදු දහම නිරතුරුව මිනිස් මනස පාලනය කිරීමට, සංවර කර ගැනීමට උපදෙස් සපයයි. එමෙන්ම පෞද්ගලික ගැටලු විසඳීමට සුවිශාල පිටුබලයක් ලබා දෙයි. සමාජ ප්‍රශ්න ලෙස සලකනු ලබන්නේ වර්ණ භේදය, ජාති වාදය, ආගම්වාදය, දිළිඳුකම, විරැකියාව, පන්ති භේදය, යුද්ධය හා බලකාමය වැනිදේ ය. මේවා ශික්ෂණයෙන් තොර ක්‍රියාකාරකම් නිසා හටගත් ඒවා ය. ඒවාට විසඳුම් ගැන සෙවීමට පළමුව, ඒවා ඇති වීමට හේතු වූ මූල බීජ විමර්ශනය සිදු කළ යුතු ය. හේතු අනුව ඵල ඇති වන බවත්, පළමුව දත යුතු ය. ඒ ඇති විට බී ඇති වෙයි.

ඒ නැතිවිට කොයි අවස්ථාවක නමුත් බී නැති වෙයි. මේ ඒ, බී දෙදෙනා තාවකාලික අන්‍යෝන්‍ය සම්බන්ධතාවයකින් පවතී. මෙම සාපේක්ෂතාව, බුදු දහම සෑම ප්‍රශ්නයක් විසඳීම විෂයෙහිම උපයුක්ත කරගනී.

> කාලානුරූපව සිදුවූ වෙනස්වීම නිසා බුදු දහමින් දක්වා ඇති සරල බව ගිලිහී ගොස් අප විසින් අනුගමනය කළ යුතු දහම් කරුණු වෙනුවට බුදු දහමින් දක්වා ඇති අනුගමනය නොකළ යුතු බැහැර කළ යුතු කරුණු කෙරෙහි බෞද්ධයන් අවධානය යොමු වී ඇති අයුරු අපට දැකිය හැකිය.

ප්‍රශ්නයක්, නිරවුල් වී දැකීමට නම්, එහි ප්‍රස්තුතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ප්‍රාථමික අවශ්‍යතායි. ද්විතියිකව, එම ප්‍රශ්න ලිහා ගැනීමට ප්‍රායෝගික ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය වෙයි. පුද්ගලයා සමාජය සමග සම්බන්ධ වනුයේ පංචේන්ද්‍රිය මඟිනි. ඇසට රූපයත්, කනට ශබ්දයත්, නාසයට ගඳ සුවඳත්, දිවට රසයත්, ශරීරයට ස්පර්ශයත් ලබා ගනියි. ඒ සෑම ඉන්ද්‍රියක්ම පංචකාම වස්තූන් සමඟ සබඳතා ගොඩනඟා ගනී.

එම සබඳතා සුබවාදී හෝ අසුබවාදී වනුයේ පවතින දැකීම අනුවය. ප්‍රශ්න පැනනැඟීමට මුල් වනුයේ පවතින දෘෂ්ටියයි. මිථ්‍යා දෘෂ්ටිය තුළින් අවුල් සහිත බවත් සම්යයක් දෘෂ්ටිය තුළින් නිරවුල් බවත් ගොඩ නැගෙයි. එනිසා නිවැරැදි දැකීමෙන් එය විග්‍රහ කර ගැනීම තමා සතු වගකීමකි. ධර්මය නිරතුරුව පුද්ගලයා මෙහෙයවනුයේ ප්‍රශ්න නිරවුල් වන මාවතකට ය.

ලොව පවතින සෑම ප්‍රශ්නයක්ම දුක පදනම්ව පවතින්නකි. සියලු දුක් නිවා ගැනීමට හේතු ඵල ධර්මයම මඟ පෙන්වයි. යමෙක් පටිච්ච සමුප්පාදය අවබෝධ කර ගනීද හෙතෙම ධර්මය අවබෝධ කර ගනියි. යමෙක් ධර්මය අවබෝධ කර ගනියි ද හෙතෙම බුදුරජාණන් වහන්සේ දකියි. ධර්මය අවබෝධ වීමත්, බුදුරදුන් දැකීමත් සියලු ගැටලු කෙළවර වීමකි. ඒ සඳහා ගන්නා ක්‍රියා පිළිවෙත ද දිනෙන් දින ප්‍රශ්න අභිබවා ඉදිරියට සාර්ථකව පියමං කරන්නකි. ප්‍රශ්නයද නිරාකරණය වෙයි. මෙසේ පියවරෙන් පියවර ගමන් කිරීම, බෞද්ධ පිළිවෙතේ සුවිශේෂ ලක්ෂණයකි.

බුදු දහම සමාජය උපමා කොට දක්වන්නේ, පද්මයෙන් ගැවසී ගත් විලකටයි. විලෙහි විවිධාකාර පද්ම දැක ගත හැකි ය. එලෙසින්ම සමාජය, නමැති විලෙහි ද විවිධ චරිත නමැති පියුම් විකසිත වෙයි. විවිධාකාර පුද්ගල චරිත ඒකරාශී වී සමාජය ගොඩනැගෙයි.

එසේ ගොඩනැගෙන සමාජය පාරිශුද්ධ වන්නේ ද, අපරිශුද්ධ වන්නේ ද එහි සාමාජිකයන්ගේ ක්‍රියාකාරීත්වය මත ය. පුද්ගලයා යනු සමාජශීලී සත්වයෙකි, යන මතය, බුදු සමය ප්‍රතික්ෂේප නොකරයි. එහිදී සන්තානගත සහ සංස්ථාගත දෙඅංශය කෙරෙහි බුදු දහම විමර්ශනශීලී වෙයි. සමාජ දුක නැති කිරීම පිළිබඳ බෞද්ධ මාර්ගය, පුද්ගල දුක නැති කිරීමේ මාර්ගය තුළින්ම වැටී ඇති අතර, පුද්ගල දුක නැති කිරීම පිළිබඳ බෞද්ධ මාර්ගය සමාජ දුක නැති කිරීම තුළින් වැටී ඇත. මේ නිසා පුද්ගලයාත් සමාජයත් අතර සම්බන්ධතාවක් පවතී යැයි බුදුදහම විශ්වාස කරයි. මෙම දෙඅංශය පිළිබඳ නිවැරැදි වැටහීමක් ලබා ගැනීමට නම් ඒ පිළිබඳ බුදු දහමේ ආකල්පය විමර්ශනය කිරීම, වැදගත් ය.

සමාජයේ සාමාජිකයිනුත් සමාජයත් ඉදිරියට නිර්මලව පවත්වාගෙන යාමට පෞද්ගලික චරිත පාරිශුද්ධිය ඇති කර ගත යුතු ය. අන් අයට ආදර්ශයක් ලබා දෙමින් සිය දිවියේ ගැටලු නිරාකරණය කරගෙන උත්තරීතර තත්ත්වයට එහි සාමාජිකයන් පියමං කිරීම ඉතා වැදගත් ය. බුදු හිමියන් ද ජීවිතයේ ලැබිය හැකි උතුම්ම සැපතට ළඟා වී ඒ අවස්ථාව සෙසු අයට ද ලබා දීමට උත්සාහ දැරූහ. බුදු සමිඳුන් සිය ශ්‍රාවකයන්ට අනුශාසනා කළේ ස්වකීය අභිමතාර්ථ සාධනය සඳහා නොවේ.

බොහෝ දෙනාට හිතසුව පිණිස ගම් නියම් ගම්වල චාරිකාවේ වැඩමකරවන ලෙස අනුදැන වදාරා තිබේ. එමඟින් එක් එක් පුද්ගලයාත් එසේ ඒකරාශී වූ සමස්ත සමාජයත් සුවපත් මාවතකට යොමු කරවූහ.

මිනිසා සමාජ සන්දර්භයක් තුළ තබා කතා කිරීමට බුදු සමය ප්‍රයත්න දරා ඇති බව, මෛත්‍රී භාවනා, සතර බ්‍රහ්ම විහරණ, සතර සංග්‍රහ වස්තු යන ධර්ම පරියායන්හි විස්තර වන ආකාරයට දැක ගත හැකි ය. පුද්ගලයා සමාජය සමඟ ක්‍රියා කරන විට සදාචාරයට හා නීතියට එකඟව ක්‍රියා කිරීම සෑම අංශයෙන්ම සුවදායක ය.

සදාචාරයෙන් ඉවත්ව නීතියට පටහැනිව ක්‍රියා කරන චරිතවලට ආගම සහ අධිකරණය යන ආයතන දෙක සුවිශාල සේවයක් ඉටු කරයි. පුද්ගල චරිතයත් සමාජ සංස්ථාවත් සදාචාරාත්මකව අර්ථවත් කිරීමට බුදු දහමේ පංචශීල ප්‍රතිපත්තිය උපයෝගී කරගත හැකි ය.

# පැවිදි වීමට ගිය පද්මසිරිට වේවැල් පහර වදී



නාගදීප විහාරය එදා

## තිස් වසරක යුද්ධය මැද නාගදීපය රැකගත් නා හිමියන්ගේ කතාව

### 02 කොටස

**නාගදීපයේ විහාරාධිපතිව වැඩසිටි අම්බලන්ගොඩ රන්දොඹේ සෝමසිරිතිස්ස නා හිමියන් අපවත් වූ අතර එහි විහාරාධිපති ධුරයට පත් බලපිටියේ බ්‍රාහ්මණවත්තේ ධම්මකිත්ති තිස්ස හිමියන් නවදගල ගමේ බීටින් මැන්දිස් මහතාගේ නිවසට වැඩම කළහ.**

එසේ වැඩම කළ හේතුව දැන ගන්නට සියලු දෙනාම වික්ෂිප්තව බලා සිටියහ.

''අපේ නායක හාමුදුරුවන්ගේ අපවත්වීමේ තුන් මාසේ පින්කම ලොකුවට නාගදීපෙ තියන්නයි මගේ බලාපොරොත්තුව'' ධම්මකිත්ති තිස්ස හිමියෝ පැවසූහ.

''එහෙමයි''

''එදාට මේ පැත්තෙ දරුවො තුන් හතර දෙනෙක් මහණ කරන්නයි මම හිතාගෙන ඉන්නෙ. ප්‍රේමරත්නගෙන් මට දැන ගන්න ලැබුණා පද්මසිරි කියන දරුවා මහණ වෙන්න කැමැතියි කියලා, ඒකයි මම මේ ආවේ, කෝ කවුද පද්මසිරි'' නායක හාමුදුරුවෝ එක දිගටම පැවසූහ.

පද්මසිරි බිම වාඩි වී උන් තැනින් නැඟිට අම්මා තාත්තා දෙසත් ඒ වෙලාවේ නිවෙසේ සිටි සහෝදර සහෝදරියන් දෙසත් බැලුවේ ය.

''ළමය මහණ වෙන්න කැමැතිද?''

ඔහුට කට උත්තර නැති විය. තමන් පැවිදි වනවාට අම්මා අකමැති බව පද්මසිරි හොඳින්ම දනියි.

එහෙත් ස්වාමීන් වහන්සේගේ ගෞරවාන්විත තේජස් පිරි මුහුණ දුටු පද්මසිරිට උන් වහන්සේට අවශ්‍ය පිළිතුර නොදී සිටින්නට බැරි විය.

''ඔව්'' පද්මසිරිගේ මුවින් නිකුත් විය.

''එහෙමනම් මේ දරුවා සූදානම් කරල තියන්න, මම හෙට අනිද්දට ප්‍රේමරත්නව එවන්නම්''.

නායක හාමුදුරුවන්ගේ කතාවට විරුද්ධව කතා කරන්නට හෝ උන් වහන්සේ විසින් කළ යෝජනාවට යම් හෝ වචනයක් කියන්නට කිසිවෙක් ඉදිරිපත් නොවුණේ උන් වහන්සේට ඇති ගෞරවය නිසා ය. ගිලන්පස වැළඳූ නායක හිමියෝ ආපසු වැඩම කළහ.

නායක හිමියන් ආපසු වැඩම කිරීමෙන් පසුව පවුලේ අය අතර පද්මසිරිගේ පැවිදි වීම ගැන වැඩි කතාවක් ඇති නොවුණත් ගමේ බොහෝ අයට ඒ ආරංචිය පැතිර ගියේ ය.

දින දෙකක් ගෙවී ගියේ පුදුමාකාර වේගයකිනි.

පසුදින උදෑසන පද්මසිරි පිබිදෙන විට අම්මා ඇදේ සිටියේ නැත. කුස්සිය පැත්තෙන් කීප දෙනෙක් කතා කරනු පද්මසිරිට ඇසුණි.

පද්මසිරි ඇඳේ සිටම කල්පනා කරන්නට විය.

'තමා නිවසේ ගිහි දිවියේ සිටිනා අවසන් දිනය අද වනු ඇත. අද ප්‍රේමරත්න අයියා එනු ඇත. අද මම මේ ගෙදර අම්මාත් සමග ඇඳේ නිදා ගත් අවසන් දිනය වනු ඇත.' එසේ සිතූ පද්මසිරිගේ නෙතින් කඳුළු ගලා ආවේ ය. පද්මසිරි පිබිදුණු බව දැනගත් කාමරයට පැමිණි අම්මා දුක නොපෙන්වා අමාරුවෙන් හිනාවුණා ය.

''මුහුණ කට හෝදා ගනින් පුතේ, අන්න මම කිරිබත් එහෙමත් හැදුවා''

කුස්සිය පැත්තෙන් තවත් අයකුගේ කටහඬක්ද පද්මසිරිට ඇසුණි. පද්මසිරි අමුත්තා කවුදැයි හොරෙන් බැලුවේ ය. ඒ ප්‍රේමරත්න අයියාය. ඔහු උදෑසනම පැමිණ ඇත. පද්මසිරි අඟුරු කෑල්ලක් ගෙන දත මදිමින් වත්ත වටේම ගියේ ය. වෙනදා පාසල් යන්නට දඟලමින් යන පද්මසිරිට පුදුමාකාර වෙනසක් දැනුණි. ආයෙත් කොල්ලොත් එක්ක බට්ට පනින්න යන්න, වෙනත් දඟ වැඩ කරන්න නොලැබෙන බව දැනගත් පද්මසිරිගේ සිත කැළඹෙන්නට විය. ඒ කිසිදු ප්‍රශ්නයකට විසඳුම් නොලැබුණු අතර අවසානයේ මවත් ප්‍රේමරත්නත් සමඟ පද්මසිරි නිවසින් පිට වූයේ සහෝදර සහෝදරියන්ගේ කඳුළු මැද ය. පියා ද කිසිදා නොදුටු දුක්මුසු මුහුණකින් යුතුව ආශිර්වාද කෙළේ ය. පද්මසිරි මහණ වන්නට යන බව දැනගත් අතරමගදී හමු වූ බොහෝ දෙනා ඔහුට පාරේ ඉඩ දී අයින් වූහ. ඔහු සමඟ වෙනදාට වඩා සිනාසුණාහ. කතා කළහ.



නාගදීපයේ දීපය

මවත් ප්‍රේමරත්නත් සමඟ පද්මසිරි දෙමටගොඩ පිහිටි නාගදීප විහාරයට පැමිණියේ ය. කුඩා පන්සලක් වූ එය ටකරං මඩුවකට නොදෙවෙනි විය. එහි විහාරාධිපති බ්‍රාහ්මණවත්තේ සීවලී හිමියන්ද එහිදී පද්මසිරිට හමු විය. නාගදීපයේ නායක හිමියන් එදිනම රාත්‍රී දුම්රියෙන් නාගදීපය බලා පිටත්ව ගිය අතර මවද පද්මසිරි පන්සලේ නවතා යළි නිවස බලා ගියේ දැඩි දුක් දොම්නසින් යුතුව ය.

අම්මා යන දෙස බලා සිටි පද්මසිරිගේ නෙතට කඳුළු ඉනුවේ ය. අම්මා ලවා බෙලෙක් පිගානේ යළිත් බත් කවා ගන්නට නොලැබෙනු ඇත. අම්මාට තුරුල් වී ඇඳේ වකුටු වී නිදා ගන්නට යළිත් නොලැබෙනු ඇත . තාත්තාට දඟ වැඩ කළ බඩ පිස්සා නැත. තාත්තාට කෝටු පහර දෙන්නට පද්මසිරි නැත. මහණ වීම මෙතරම් දුකක් වනු ඇතැයි පද්මසිරි සිතුවේ නැත .

අම්මා පිටත්ව ගිය පසු පද්මසිරි ඉකි ගසමින් ඇඬුවේ ය. පන්සලේ සිටි සාමණේර හිමිවරුන් තුන් නමක් පද්මසිරි සැනසුවේ ය. එදින ඇතිවුණු අප්‍රමාණ දුක ලෙහෙසින් තුරන් කරන්නට හැකි වූයේ නැත.



බ්‍රාහ්මණවත්තේ සීවලී අනු නා හිමි

රාත්‍රියේ තනිවම බත් කද්දී පද්මසිරිට අම්මා මතක් විය. යළිත් නෙතට කඳුළු ආවේ ය. ඔහු නිදි ලොවට පිවිසුණේ බොහෝ වේලාවකට පසුව ය.

පසු දින උදෑසන විහාරාධිපති සීවලී හිමියන් කොටහේන විද්‍යාලයට උගැන්මට වැඩම කළහ. සාමණේර හිමිවරුන් තිදෙනාත් පද්මසිරිත් හොඳහැටි සෙල්ලම් කළහ. දහවල් වන විට කරන්නට සෙල්ලමක් ඉතිරිව නොතිබුණි.

පන්සලේ තිබුණු වතුර පයිප්පය (හෝස්) දුටු පද්මසිරි අලුත්ම සෙල්ලමක් කෙළේ ය. වතුර පයිප්පය එක් එක් සාමණේර හිමිවරුන් වෙතට ඇල්លූ පද්මසිරි සියලු දෙනා තෙත බරියම් කෙළේ ය. ඔහුද හොඳ හැටි නා ගෙන සිටියේ ය.

පසුව ඔහුට අලුත් අදහසක් ආවේය. සාමණේර හිමිවරුන් සමඟ එක්ව වතුර බටයේ කෙළවරක් ඇඟිලිවලින් තරමක් වැසුවේ ය. වතුර පාර වේගයෙන් විද්දේ ය. වතුර බටය ඉහළට විද්දේ පාරේ මිනිසුන් යන වේලාවන්හිදී ය. පාරේ ආ ගිය අය කුරුල්ලන් මළ පහ කළ බව සිතමින් පිස දමන්නට යමක් සෙවූහ. ඔවුන් වඩාත් විනෝද වූයේ පාරේ ආ ගිය අය කලබල වී දුවනා සැටි දැකීමෙනි. එහෙත් වූයේ කුමක්දැයි කිසිවකු දැන සිටියේ නැත. සිවු දෙනාම වතුර ඉහළට යනවාත් සමගම සැඟවුණාහ. මේ අමුතු සෙල්ලම හරිම විනෝදකාමී විය.

සෙල්ලම දිගටම කරගෙන යද්දී එක්වරම පද්මසිරිගේ පිටට තද වේවැල් පහරක් වැදුණි. එය කුමක්දැයි බලන්නට යන විට හිසට තවත් වේවැල් පහරක් තදින් වැදුණි. පද්මසිරි වතුර ගොඩේ බිම ඇද වැටුණේ ය. ඒ සමඟම සාමණේර හිමිවරුන්ගේ හිසටද වේවැල් පහර වැදුණි.

**(මතු සම්බන්ධයි)**

> පද්මසිරි අඟුරු කෑල්ලක් ගෙන දත් මදිමින් වත්ත වටේම ගියේ ය. වෙනදා පාසල් යන්නට දඟලමින් යන පද්මසිරිට පුදුමාකාර වෙනසක් දූනුණි. ආයෙත් කොල්ලොත් එක්ක බට්ට පනින්න යන්න, වෙනත් දඟ වැඩ කරන්න නොලැබෙන බව දූනගත් පද්මසිරිගේ සිත කැළඹෙන්නට විය.

**තාරක වික්‍රමසේකර**